# බළන්ගොඩ නගර සභාව

## 2021-11-09 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.11.09**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

1. ගරු සභාපති — චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති — එම්.ටී.එම්.රුමී මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී — ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී — ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී — එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී — එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී — නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රිනි — ජී. චන්ද්‍රලතා මැතිතුමිය
9. ගරු නාගරික මන්ත්‍රී — එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රී — එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
11. ගරු නාගරික මන්ත්‍රිනි — පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය
12. ගරු නාගරික මන්ත්‍රීනී — සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
13. ගරු නාගරික මන්ත්‍රිනි — එම්. ශාන්තිලේඛා මැතිතුමිය
14. ගරු නාගරික මන්ත්‍රී — කේ. ජී. පේමදාස මැතිතුමා
15. ගරු නාගරික මන්ත්‍රීනී — මංගලිකා ඉලංකෝන් මැතිතුමිය

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

**01. පසුගිය මහ සභා වාර්තාව, හා විශේෂ සභාවේ සභා වාර්තා සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2021-10-18 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2021-10-29 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් 2021-10-18 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2021-10-29 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021-10-18 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2021-10-29 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමා විසින් නිවේදන වාරය ආරම්භ කරමින් සභාවේ කටයුතු වාර්තා කළ මාධ්‍යවේදී එස්.රාමාර් මහතාගේ අභාවය සම්බන්ධයෙන් බළන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ගේ ද ලේකම්තුමිය ඇතුළු නිළධාරී මණ්ඩලයේ ද බළන්ගොඩ ප්‍රජාවගේ ද ශෝකය පළ කරන බව පවසන ලදී.

  **පෙ.ව 10.13 ට පමණ ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- අසනීප තත්ත්වයක් හේතුවෙන් 2021-11-09 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

  **පෙ.ව 10.17 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**
  **පෙ.ව 10.17 ට පමණ ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- ස්වයං රැකියා සම්මේලනය මඟින් ලබා දුන් වෙළඳ කුටියක් තමන්ට ද ලැබී ඇති අතර, බළන්ගොඩ බස් නැවතුම්පළෙහි ගුවන් පාලම යට යෝජිත පැන්තාලිය ඉදි කරන ස්ථානයේ එම පැන්තාලියට පිටුපස තිබෙන හිස් ඉඩ කොටසෙහි තමන්ට හිමි වෙළඳ කුටිය තබා ගැනීමට අවසර දෙන මෙන් ඉල්ලා බළන්ගොඩ, හුණුකුඹුර පාර, අංක 21/17 දරණ ලිපිනයේ පදිංචි ආර්.පී.ඒ.පී. වීරකෝන් යන අය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් පසුගිය සභාවේ දී ද මෙම ඉල්ලීම සම්බන්ධයෙන් සාධනීය කරුණු සාකච්ඡා වූ අතර, මේ සඳහා අවසර ලබා දුනහොත් එම ස්ථානයේ මීට පෙර සිටි අය නැවත තමන්ගේ වෙළඳ කටයුතු කිරීමට බලා සිටින බව ද එසේ වුවහොත් සියලුම දෙනාට අවසර දීමට සිදු වන බව ද පවසන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා, මෙම ස්ථානයේ මීට පෙර බුලත් විට විකුණන කෙනෙකු සිටි අතර, පදික කඩ ලබා දීමේ දී එම අයට ලබා නොදුන්නේ ඇයිදැයි විමසීය. එමෙන්ම පදික වෙළඳාමේ නිරත නොවූ අය පවා පදික කඩවල වෙළඳාම් කටයුතු සිදු කරන බව ද නව නගර සංවර්ධන සැලැස්ම ගැසට් කළ පසු වෙනත් කිසිම සංවර්ධනයක් කළ නොහැකි බැවින් පදික කඩ ඉදිකිරීම පිළිබඳව තමන් විරුද්ධ වූ බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා එසේ පැවසුව නමුත් එතුමාගේ කාලයේ දී පොළ වැසිකිළියට අලලා මාළු කඩ ඇති කළ අතර, එම කාලයේ දී සභාවම විරුද්ධ වූ නමුත් තනි මතයට කටයුතු කළ බව ද තමන් පදික කඩ ලබා දුන්නේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගනිමින් සභාවේ ඒකමතික සම්මත වීමකින් පසුව සාධාරණව හා අවශ්‍ය සාධක සපුරාලූ අයට බව ද අනෙකුත් අය වෙත ඉදිරියේ දී යම් සහනයක් ලබා දීමට බලාපොරොත්තු වන බව ද පැවසීය.

එමෙන්ම ආසියානු පදනමේ මූල්‍ය අනුග්‍රහයෙන් සභාවේ උප කාර්යාලයක් බස්නැවතුම්පළ පාලම අසල ඉදි කිරීමට යෝජනාවක් තිබුණු බැවින් මෙම ස්ථානය ඒ සඳහා වෙන් කළ අතර, තාවකාලිකව ලබා දීමේ ගැටලුවක් නොමැති බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් ස්වයං රැකියා සඳහා ලබා දීමේ ගැටලුවක් නොමැති වුව ද සභාවක් වශයෙන් යම් ගිවිසුමකට එළඹීමේ දී එම ගිවිසුම 100% ක් සභාවට වාසි වන පරිදි ගිවිසුම්ගත විය යුතු අතර, කොන්දේසි කඩ කිරීමේ දී සභාපතිවරයාට එම බලය භාවිත කර, තීරණ ගත හැකි වන ආකාරයට සකස් කළ යුතු බවද පැවසීය.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසුවේ මෙය ඉල්ලීමක් වන බැවින් මීළඟ සභා වාරයේ දී විධිමත් පරිදි න්‍යාය පත්‍රයට ඇතුලත් කර අනුමැතියක් ලබා ගැනීම සුදුසු බවයි.

- 2019 වර්ෂයේ ඇති වූ පාස්කු ප්‍රහාරය හා 2020 හා 2021 වර්ෂයන්හි ඇති වූ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය නිර්දේශ මත ව්‍යාපාරය පවත්වා ගෙන යාමට නොහැකිව නොයෙක්

අවස්ථාවල දී වසා තැබූ බවත්, 2021 අප්‍රේල් සිට සැප්තැම්බර් මස දක්වා කාලයේ දි පැවැත්වීමට සූදානම් වූ විවාහ මංගල උත්සව 17 ක් 2022 වර්ෂය දක්වා කල් ගොස් ඇති බවත් ඒ වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලබා ගෙන ඇති නමුත් ව්‍යාපාරය බිඳ වැටීම හේතුවෙන් මුදල් නැවත ගෙවීමට නොහැකි බවත් පවසා 2022-02-28 දිනෙන් අවසන් වීමට නියමිත තානායමේ ටෙන්ඩර් කාලය 2024-02-28 දක්වා දීර්ඝ කර දෙන මෙන් බළන්ගොඩ තානායමේ ටෙන්ඩර්කරු වන ඉන්දික එරික් සිසිල් යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, මෙය සභාව සතු දේපලක් වන නමුත් රජයේ වත්කමක් බැවින් රජයේ චක්‍රලේඛ, රෙගුලාසි අනුව අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව ද චක්‍රලේඛ පැහැදිලිව තිබිය දී ඊට පටහැනි දෙයක් කිරීමෙන් සභාව හැල්ලුවට ලක් විය හැකි බව ද සභාව මඟින් තීරණය කර කාලය දීර්ඝ කිරීමට නොහැකි අතර, ගිවිසුම අවසානයේ දී ටෙන්ඩර් කිරීමකට යා යුතු වන බව ද ව්‍යාපාරය වසා තැබූ කාලය සඳහා සභාවෙන් සහන ලබා දී ඇති බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පසුගිය කාල වකවානු තුළ ආදායමක් නොතිබුණු නිසා මංගල උත්සව සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල් ගෙවීමට නොහැකි බැවින්, මානුෂිකව සලකා බලා සභා තීරණයක් ගෙන ගරු ආණ්ඩුකාරතුමාට යොමු කිරීම සුදුසු බව පැවසීය.

මෙහි දී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, පවසන්නා වූ කාරණය සත්‍ය බැවින් ඒ සම්බන්ධව සාධාරණව සලකා බලා තීරණයක් ගන්නා ලෙස පවසන ලදී.

ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා අදහස් දක්වමින් ටෙන්ඩර් කාලය අවසන් වන බැවින් ඉදිරියට තවත් අවුරුද්දක් හෝ දෙකක් දීර්ඝ කර ලබා දීමේ හැකියාවක් පවතී දැයි සබරගමුව පළාත් පාලන කොමසාරිස්තුමා සහ ගරු ආණ්ඩුකාරතුමාගෙන් විමසා බැලීම සුදුසු බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුවේ තානායම් ටෙන්ඩර්කරුගේ ඉල්ලීම සාධාරණ බැවින් කාලය දීර්ඝ කිරීමට හැකියාවක් ඇත්නම් එය සිදු කරන ලෙසයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මේ සම්බන්ධව මීළඟ සභාවෙහි න්‍යාය පත්‍රයට ඇතුලත් කර තීරණයක් ගැනීම සුදුසු වන අතර, අවශ්‍ය නම් පළාත් පාලන කොමසාරිස්තුමා වෙතින් පූර්ව විමසීමක් කළ හැකි බව ද පවසන ලදී.

- බළන්ගොඩ, සමගි මාවත, නො.339/38 ලිපිනයේ පදිංචි එස්.කේ. එමිකා රෝෂණී ද සිල්වා යන අය සිව් දරු මවක් වන අතර, ස්වාමියා වසර 02 කට ඉහත දී මිය ගිය බවත්, තමන් රැකියාවක නිරත නොවන බවත් පවසා බලගහමුල කොම්පෝස්ට් අලෙවි සැල පවතින කඩ පේලියේ ඇති

හිස් කඩ කාමරය මාසික කුලී පදනම මත මල් වෙළඳාම කරගෙන යාමට ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු සභාපතිතුමා, සම්පත් පියසෙහි කඩ කාමර 06 ක් පවතින අතර, ඉන් 05 ක් සම්පත් පියසෙහි කටයුතු සඳහා යොදා ගන්නා බව ද එක් කඩ කාමරයක් වයි.ජේ.ජේ. ඩේවිඩ් යන අයට මාසිකව රු.2,777.78 ක මුදලකට බදු දී ඇති බව ද එම ගොඩනැගිල්ලෙහි ඉහළ නව කඩ කාමර ඉදිකිරීමෙන් අනතුරුව වැඩි මුදලකට ටෙන්ඩර් කිරීමට හැකි වන බව ද බළන්ගොඩ නගරයේ කඩ කාමර සාධාරණ මුදලකට ලබා දීම නිසා සභාවට ලැබීමට තිබූ විශාල ආදායමක් අහිමි කරගෙන ඇති බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් තම පාලන කාලය තුළ නඩුවක් මගින් මෙම ඉඩම ලබා ගත් අතර, කඩ ඉදිකිරීමෙන් පසුව කැඳ විකිණීම සඳහා පුද්ගලයෙකු වෙත ලබා දුන් බව ද 2015 වර්ෂයෙන් පසු එම ස්ථානය කැඳ විකිණීම සඳහා නුසුදුසු යැයි පවසා වෙනත් අයෙකු වෙත ලබා දී ඇති බව ද සභාවට පැමිණ පළමු වසරේ මෙම කඩය ලබා දෙන්නේ කාටදැයි විමසූ අවස්ථාවේ දී කඩය කරගෙන යන පුද්ගලයාටම ලබා දෙන බව පැවසූ බව ද දෙවන හා තුන්වන වසරවල දී තමන් නිහඬව සිටි නමුත් මෙම වසරේ අනෙකුත් සියලුම කඩ සම්බන්ධව න්‍යාය පත්‍රයේ සඳහන්ව ඇතත් මෙම කඩය සම්බන්ධව කිසිදු සඳහනක් නොමැති බව ද වාර්ෂිකව ගිවිසුම්ගත වී කඩ ලබා දෙන්නේ නම් දැනට සිටින පුද්ගලයාටම දිගින් දිගට ලබා දීමේ ක්‍රමය කුමක්දැයි සභාව දැනුවත් කරන ලෙස ද පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසුවේ බළන්ගොඩ සුවිශේෂී නගරයක් වන බැවින් උඩ තට්ටුවෙහි මල් පැල වෙළඳාමට ලබා දීම සුදුසු බවට තමන් යෝජනා කරන බවයි.

නමුත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පිළිතුරු ලබා දෙමින් උඩ තට්ටුව පැරණි භාණ්ඩ අලුත්වැඩියා කිරීම සඳහා ලබා දීමට සැලැස්මක් පැවති බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය, ටෙන්ඩර් කිරිම මගින් කඩ කාමරය වැඩි මුදලකට ලබා දීමට හැකි වන බව පැවසූ අතර, ගරු සභාපතිතුමා පැවසූවේ ටෙන්ඩර් කරන්නේ නම් තක්සේරු කිරීම කළ යුතු බවයි.

මෙහි දී අදහස් දක්වූ ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා, මෙම ස්ථානයෙහි කොම්පෝස්ට් අලෙවිසැල පවතින බැවින් මල් පැල වෙළඳාම සඳහා ලබා දීම සුදුසු වන බව ද සභාවේ සාකච්ඡා කර අවුරුද්දක කාලයක් සඳහා සාමාන්‍ය පවතින මිලකට කඩ කාමරය ලබා දී ඉන්පසු තක්සේරු කර ටෙන්ඩර් කිරීම සුදුසු බව ද නාම පුවරුව පවතින නිසා තක්සේරු කිරීමේ ගැටලුවක් පවතින අතර, 2015 වර්ෂයට පෙර එවක සිටි ගරු සභාපතිතුමා විසින් කඩ කාමරයක් ඉදි කර ඇති බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කඩ කාමරය පිළිබඳ ගැටලුව සාකච්ඡා වූයේ මෙම ලිපිය ඉදිරිපත් කිරීම සමඟ බව ද ඉල්ලීම පිළිබඳව සලකා බලා එම කඩ කාමරය මල් පැළ වෙළඳාම වෙනුවෙන් ලබා දීම සුදුසු බව පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පැවසුවේ මෙම කඩ කාමරය පිළිබඳව තමන් ගරු සභාපතිතුමාගෙන් විමසූ අවස්ථාවේ දී ටෙන්ඩර් කරන බවට පැවසූ බවයි.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් තමන් පෙර දිනයේ අදාල ලිපිගොනුව අත්සන් කරනු ලබන අවස්ථාවේ දී මෙම කඩ කාමරය ටෙන්ඩර් කිරීමට සිතුව නමුත් ඒ වන විට න්‍යාය පත්‍රය සකස් කර අවසන් බැවින් එයට ඇතුලත් කිරීමට නොහැකි වූ බව ද එකිනෙක වෙනස් ප්‍රතිපත්තීන්වලට යොමු වීම වෙනුවට නීත්‍යානුකූල තත්ත්වයත් සමඟ කටයුතු කළ යුතු බව ද මීළඟ සභාවේ න්‍යාය පත්‍රයට ඇතුලත් කර තීරණයක් ගැනීම සුදුසු බව ද පවසන ලදී.

- 2020 වර්ෂයේ දී බළන්ගොඩ නගර සභාවට අයත් දැන්වීම් පුවරු 10 ක් ටෙන්ඩරයක් මඟින් ලබා ගත් අතර, එම කාල සීමාව 2021 නොවැම්බර් මාසයෙන් අවසන් වන බැවින් තැන්පත් කර ඇති ඇප මුදල ආපසු ලබා දෙන ලෙස පවසමින් බළන්ගොඩ, එ/වලේබොඩ, පූජාපිටිය ලිපිනයේ පදිංචි පී. කේ. මහින්දසේන යන අය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව යෝජනාවක් 2021-06-25 දිනැති මහ සභාවේ අංක 04:01:38 යටතේ ඉදිරිපත්ව තිබුණු අතර, එහිදී තීරණය වූයේ මෙය ටෙන්ඩර් කොන්දේසි උල්ලංඝනය කිරීමක් වන බැවින් නීත්‍යානුකූලව මෙම මුදල නිදහස් කළ නොහැකි බවයි. ඒ අනුව ඇප මුදල් ආපසු ලබා නොදීමට තීරණය විය.

- යසෝදරා විශේෂ පාසලට පිවිසෙන මාර්ගය පිළිසකර කර දීම සම්බන්ධව ස්තුතිය පළ කරමින් එම පාසලේ විදුහල්පතිනිය විසින් එවා ඇති ස්තුති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා තදබදයක් ඇති වී ඇති බව ද ගැබිණි මව්වරුන් පඩිපෙළ මතින් ප්‍රතිකාර සඳහා යොමු වන බැවින් එය ඉතා අවදානම් තත්ත්වයක් බව ද මෙම ස්ථානයට පැමිණෙන ත්‍රී රෝද රථ නිසා මාර්ගය අවහිර වී ඇති බව ද බළන්ගොඩ පොලිසිය අසල ඇති පුස්තකාලය හා නේවාසිකාගාරය මෙම සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා සංවර්ධනය කරන ලෙස ද සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය ඉදිරිපිට විදුලි බුබුල අක්‍රිය වී ඇති බැවින් විදුලි බුබුලක් සවි කරන ලෙස ද පවසමින් බළන්ගොඩ, කොටුගොඩැල්ල, අංක 19 ලිපිනයේ පදිංචි ධනපාල යන අය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමන් මේ සම්බන්ධව අදහස් දක්වමින් මව්වරුන් සඳහා වේලාව වෙන් කර ලබා දෙන නමුත් කල් වේලා ඇතිව පැමිණ පෝලිම්වල සිටින බැවින් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ තදබදයක් ඇති වී ඇති බව ද මාර්ගය අවහිර වීම සම්බන්ධව නීත්‍යානුකූලව

ක්‍රියාත්මක වීමට නොහැකි බව බළන්ගොඩ රථවාහන අංශය පවසන අතර, රත්නපුර රථවාහන අංශයේ ප්‍රධානියා ගෙන්වා මොවුන්ට අවවාදයක් ලබා දීමට කටයුතු කරන බව ද අක්‍රිය වී ඇති විදුලි බල්බ ඇත්දැයි පරීක්ෂා කර බලා එම බල්බ නැවත සවි කිරීමට හැකි බව ද පවසන ලදී.

- උඩකන්ද පාර පිවිසුමේ සිට රාත්‍රියට ගමන් කිරීමේ දී විදුලි බල්බ නොමැති වීම නිසා ජනතාව අපහසුතාවයට පත්වන බැවින් විදුලි බල්බ සවි කර දෙන ලෙස පවසා බළන්ගොඩ, උඩකන්ද, නො.73 /ඒ /1 ලිපිනයේ පදිංචි ඩබ්.එම්. නන්දා ජයසූරිය යන අය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහි දී අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, බළන්ගොඩ නගරය ආශ්‍රිතව විදුලි බල්බ සවි කිරීමෙන් අනතුරුව අක්‍රිය වී ඇති විදුලි බල්බ සවි කිරීමට හැකි බව පවසන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා වීරසුන්දරාරාම මාවතේ පන්සල ආසන්නයට විදුලි බල්බ යොදන ලෙස පැවසීය.

- පසුගිය වසර 13 ක කාලයක සිට කුකුල් මස් ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය නමුත් බුදු පිළිමය ඉදිරිපිට එම ව්‍යාපාරය පවත්වා ගෙන යාමට අවසර නොමැති බවට ගරු සභාපතිතුමා පැවසීමත් සමඟ තමන් ව්‍යාපාරය අත්හැරි බව ද එම ස්ථානයේ වෙනත් පුද්ගලයෙකු කුකුල් මස් ව්‍යාපාරය පවත්වාගෙන යන බව ද පවසා බළන්ගොඩ, පොළ පාර ලිපිනය සහිතව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමන් මේ සම්බන්ධව පරීක්ෂා කර බලා කරුණු වාර්තා කරන ලෙස ආදායම් අංශ විෂය නිළධාරී වෙත පැවසීය.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම**

04:01 සභාව සතු වාහන 2022 වර්ෂය සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් ටෙන්ඩර් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, ජාතික රක්ෂණ භාර අරමුදල හා සීමාසහිත සමූපකාර රක්ෂණ සමාගම යන ආයතනයන්ගෙන් මිල ගණන් ඉදිරිපත් වී තිබුණු අතර, 2021-12-24 දින සිට 2022-12-24 දින දක්වා කාලයක් සඳහා හිමිකම් සහ වරප්‍රසාද ඇතුලත්ව වාහන රක්ෂණය කිරීමට අවම මිල ගණන වන රු. 288,638.21 ක මුදල ඉදිරිපත් කළ ජාතික රක්ෂණ භාර අරමුදල

වෙතින් අදාල සේවාව ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

05:01:01 තුඹගොඩ බස්නැවතුම්පළ සම්බන්ධ වර්තමාන තත්ත්වය කෙසේ ද? (සම්බන්ධීකරණ කමිටුව මේ සම්බන්ධව සභාවට දනුම් දුන්නා ද? ඒ පිළිබඳව සභාව දනුවත් කරන්න.)

මෙහි දී ගරු සභාපතිතුමා මෙය සාංඝික දේපලක් බැවින් ඒ සඳහා තුඹගොඩ විහාරස්ථානයේ විහාරාධිපති හිමියන්ගේ එකඟතාවය අනිවාර්යෙන්ම අවශ්‍ය වන බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විසින් සම්බන්ධීකරණ කමිටුවට මේ සම්බන්ධව යොමු කළ අතර, නැවත වරක් එතුමාව දනුවත් කිරීම මඟින් මෙය ඉටු කරගත නොහැකි දැයි විමසන ලදී.

එහි දී ගරු සභාපතිතුමා පැවසුවේ එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් සිදු කරනු ලබන වැඩ කටයුතු සමග සැසඳීමේ දී මෙය ඉතා සුළු කාරණාවක් බැවින් එය අප විසින් විසඳීමට කටයුතු කිරීම සුදුසු බවයි. ඒ අනුව කොට්ඨාසය නියෝජනය කරන ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා, විහාරස්ථානය සමඟ සමීපව කටයුතු කරන ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය සමඟ වැඩ අධිකාරීතුමා සම්බන්ධ වී විහාරස්ථානයට ගොස් විහාරාධිපති හිමියන්ගේ එකඟතාවය ලබා ගැනීමට හැකි නම් කඩිනමින් මෙම ගැටලුව විසඳිය හැකි බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් මීට පෙර අවස්ථාවකදී මිලියන 02 ක මුදල් ප්‍රතිපාදන විහාරස්ථානය සඳහා වෙන් කළ නමුත් එම මුදල් ලබා නොදීම නිසා විහාරස්ථානය වෙත ලබා දීමට නොහැකි වූ බව ද ඉන්පසු මෑතක දී දාන ශාලාව සෑදීම සඳහා මිලියන එක හමාරක මුදලක් ලබා දෙන බව පැවසුව නමුත් පසුව විහාරස්ථාන සඳහා මුදල් ලබා නොදෙන බව පවසමින් එම මුදල ලබා නොදුන් බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මෙම බස් නැවතුම්පළ සිංහ සමාජයෙන් ඉදි කිරීම සඳහා සූදානම් වූ අවස්ථාවේ දී හාමුදුරුවන් අකමැති වූ බව ද අවශ්‍ය නම් පන්සලේ පහළ ප්‍රදේශයට පස් පුරවා දීමට හැකි බව ද පැවසීය.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

06ඃ01ඃ01 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

| ද්‍රව්‍ය | ප්‍රමාණය | දැනට ගබඩාවේ ඇති ප්‍රමාණය |
|---|---|---|
| Colour Tape Red | 50 | |
| 10 x 15 Envolop | 250 | 20 |
| 12.5 Bulb | 20 | |
| Foot Ruler | 20 | 03 |
| Double side file | 100 | 30 |
| Battery | | 10 |
| Highlight Pen | 10 | 03 |
| Calculators | 10 | 01 |
| Black file | 05 | |
| Epson LQ 2190 Ribben | 03 | 01 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ02 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

i. බළන්ගොඩ නගර සභාවේ නිල වෙබ් අඩවිය සඳහා (2021 නොවැම්බර් 02 සිට 2022 නොවැම්බර් 01 දක්වා) වාර්ෂිකව ගෙවනු ලබන web hosting renewel charges වෙනුවෙන් Procons Infotech (pvt) LTD ආයතනය වෙත රු.13,500.00ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ii. 67-3301 ජල බවුසරය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් පී.එම්.කේ හාඩ්වෙයාර් වෙත රු. 42,320.00 ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

iii. 227-5020 ගලි බවුසරය සඳහා හෝස් අඩි 100 ක් ලබා ගැනීම වෙනුවෙන් කැළණි ඒජන්සි වෙත රු. 25,000.00 ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

iv. බොබ් කැට් යන්ත්‍රයේ බකට් එක සහ දොර අලුත්වැඩියා කිරීම වෙනුවෙන් තෙබුවන ගරාජය වෙත රු. 30,300.00 ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

v. ZA 0228 ගිනි නිවන රථය සඳහා 100 Amp Lucas වර්ගයේ බැටරි දෙකක් ලබා ගැනීම වෙනුවෙන් චමින්ද බැටරි මාට් වෙත රු. 48,440.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

vi. LL 7688 අංක දරණ ෆෝටොන් කෲ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉංජිනියරින් ආයතනය වෙත රු.15,055.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

vii. ND 5124 අංක දරණ වෑන් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉංජිනියරින් ආයතනය වෙත රු.15,870.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

viii. බළන්ගොඩ නගරය පවිත්‍ර කිරීමේ සේවාව හා බළන්ගොඩ බස් නැවතුම්පොළ හා මහජන පොළ වැසිකිළි පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම, ගාස්තු අය කර පවත්වාගෙන යාම ටෙන්ඩර් කිරීමට අදාල පුවත්පත් දැන්වීම් පළ කිරීම (දිනමිණ හා තිණකරන් පුවත්පත - 2021 අගෝස්තු 16 හා 2021 ඔක්තෝම්බර් 11 පළ කරන ලද දැන්වීම්) වෙනුවෙන් ලේක්හවුස් ආයතනය වෙත රුපියල් 121,230.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ix. HF 7899 ජේසීබී යන්ත්‍රයේ ඉන්ජෙක්ටර් පොම්පය, සයිලන්සරය, පිටුපස ආම් එක, ඇස්ට්‍රාටික් ජැක් එක, එන්ජිම් මවුන්ට්, බ්‍රේක් ඔයිල් ටැංකිය, ඩීසල් ෆිල්ටරය සහ වයරින් එක අලුත්වැඩියා කිරීම වෙනුවෙන් තෙබුවන ගරාජ් වෙත රු. 205,900.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

x. ZA 0228 ගිනි නිවන රථයේ ග්‍රීස් නිපල් දැමීම, ඉදිරිපස වම්පැත්ත රෝදයේ බ්‍රේක් සිලින්ඩර් සෑදීම, පිටුපස ඇක්ස්ලේටර් ලිවර් එක සෑදීම හා හෝස් සෑදීම වෙනුවෙන් තෙබුවන ගරාජ් වෙත රු. 25,070.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

xi. PF 4006 අංක දරණ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉංජිනියරින් ආයතනය වෙත රු.15,414.75ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

xii. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අදාල පුවත්පත් දැන්වීම් පළ කිරීම (දිනමිණ හා තිණකරන් පුවත්පත - 2021 ඔක්තෝම්බර් 05 පළ කරන ලද දැන්වීම්) වෙනුවෙන් ලේක්හවුස් ආයතනය වෙත රුපියල් 129,322.50 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

xiii. බළන්ගොඩ නගර සභාවේ නඩු සඳහා බළන්ගොඩ දිසා අධිකරණය ඉදිරියේ පෙනී සිටීම වෙනුවෙන් සේවා ගාස්තු වශයෙන් රු. 46,000.00 ක මුදලක් නීතිඥ ඩී.එම්. චන්ද්‍රසේකර මහතා වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2021-07-20 | 227-5020 ගලි බවුසරයේ ඕල්ටනේටරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් චමින්ද ඔටෝ ඉලෙක්ට්‍රිකල් වෙත ගෙවීම | 55 | 066688 | 16,825.00 |
| 2021-08-03 | බොබ් කැට් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් C-com equipment Pvt ltd වෙත මුදල් ගෙවීම | 14-2 | 066750 | 48,114.00 |
| 2021-09-16 | HF 8558 ට්‍රැක්ටර් රථයේ ගියර් බොක්ස් හා පීනියන් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් පියසිරි ඉංජිනියරින් වෙත මුදල් ගෙවීම | 18 | 066878 | 143,999.00 |
| 2021-09-16 | ZA 9835 ගලි බවුසරයේ කම්ප්‍රෙෂරයේ සිට එයාර් ක්ලීනරය දක්වා රබර් හෝස් එක යකඩයෙන් පයිප්පයක් සෑදීම වෙනුවෙන් තෙබුවන ගරාජ් වෙත මුදල් ගෙවීම | 22 | 066879 | 18,250.00 |
| 2021-09-16 | ND 5124 වෑන් රථයේ වී බෙල්ට් එක අලුත්වැඩියා කිරීම වෙනුවෙන් නැෂනල් මෝටර් වේස් වෙත මුදල් ගෙවීම | 28 | 066880 | 39,750.00 |
| 2021-09-24 | සිමෙන්ති මිටි 35 ක් මිළ දී ගැනීම (සංස්ථා) වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් වෙත මුදල් ගෙවීම | 89 | 067030 | 35,000.00 |
| 2021-10-01 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-09-16 සිට 2021-09-30 දක්වා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම | 01 | 066919 | 317,891.00 |
| 2021-10-05 | ජී.ඒ.එස්.එල්. රණතුංග - ටෙන්ඩර් ඇප තැන්පතු නැවත ගෙවීම | 02 | 066920 | 10,000.00 |
| 2021-10-07 | පෝස්ට් මාස්ටර් ජනරාල් (මුද්දර) | 05 | 066930 | 10,000.00 |
| 2021-10-07 | සුහසරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය ( ගලපල්ලෙඅරාව කොළණී මාර්ගය පැති බැම්ම - රැඳවුම් ගාස්තු ගෙවීම) | 06 | 066931 | 34,103.80 |
| 2021-10-07 | දෛනික වැටුප් (සුසාන භූමි, කසළ) | 07-2<br>07-6 | 066923 | 112,475.00 |
| 2021-10-11 | විදුලි කාර්මික රක්ෂණය - ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය | 08 | 066937 | 12,281.01 |
| 2021-10-11 | මාර්ගස්ථ මුදල් රක්ෂණය - ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය | 09 | 066938 | 54,730.51 |
| 2021-10-11 | බළන්ගොඩ තානායමේ බලපත්‍ර හා මුද්දර ගාස්තු ආපසු ගෙවීම - ඉන්දික එරික් සිසිල් මහතා | 13 | 066942 | 141,975.00 |
| 2021-10-12 | ලංකා විදුලි බල මණ්ඩලය (හෝරස්ථම්භය, සම්පත් පියස, බැංකියවත්ත, වැවවත්ත, පොදු වෙළඳසැල, මහජන පොළ, මුරකුටිය, වැසිකිළි,ප්‍රේක්ෂකාගාරය) | 21 | 066944 | 15,008.45 |
| 2021-10-12 | ඩයලොග් ඉන්ටර්නෙට් බිල් ගෙවීම (කාර්යාලය) | 29 | 066948 | 11,340.00 |
| 2021-10-13 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (මුද්දර) | 34 | 066951 | 46,986.75 |
| 2021-10-15 | පෙරේරා ටයර් සර්විස් ( ජේසීබී යන්ත්‍රය සඳහා ටයර්) | 35 | 066952 | 186,875.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2021-10-18 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-10-01 සිට 2021-10-15 දක්වා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම | 40 | 066968 | 320,025.00 |
| 2021-10-25 | ලංකා විදුලි බල මණ්ඩලය ( බස් නැවතුම්පළ) | 55 | 067004 | 24,974.87 |
| 2021-10-26 | ජාතික ජල සම්පත් මණ්ඩලය (බස්නැවතුම්පළ) | 56 | 067005 | 45,524.88 |
| 2021-10-27 | මෛත්‍රී ග්‍රාම සංවර්ධන සමිතිය ( පරිවාස කාර්යාලය අලුත්වැඩියා කිරීමේ රැඳවුම් ගාස්තු) | 67 | 067016 | 74,657.07 |
| 2021-10-27 | විශ්‍රාම වැටුප් අරමුදල | 68 | 067017 | 196,311.60 |
| 2021-10-27 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් (විශ්‍රාම වැටුප් හිඟ සාමාජික මුදල්) | 70 | 067020 | 36,598.80 |
| 2021-10-29 | බී.කේ.ජේ.එස් අමරදාස - ඉන්ධන බිල්පත් පියවීම | 87 | 067028 | 72,948.83 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 2021 දෙසැම්බර් මස සභාවේ ගරු සභිකරුන්ගේ දීමනාව ලෙස රු.270,000.00 ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 2021-11-09 දින සිට දෙසැම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සෞඛ්‍ය සේවා සඳහා වියදම් ඇස්තමේන්තුව වන රු. 55,889.00 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

(2021-10-16 දින සිට 2021-11-08 දක්වා වියදම රු. 50,330.00)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 2021 දෙසැම්බර් මස සභාවේ නිළධාරීන්ගේ අතිකාල හා ගමන් වියදම් ඇස්තමේන්තුව සඳහා රු.300,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
(2021 ඔක්තෝම්බර් මස අතිකාල හා ගමන් වියදම් රු. 63,536.00 )

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 2021-11-09 දින සිට දෙසැම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ සංග්‍රහ වියදම් ලෙස රු.50,000.00 ක මුදලක් වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

(2021 ඔක්තෝම්බර් මස සභාවේ සංග්‍රහ වියදම් රු. 19,625.00)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06෴01෴08 2021-11-09 දින සිට 2021 දෙසැම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ වාහනවල හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා රු.300,000.00 මුදලක් වියදම් කිරීම හා ඒ සඳහා මුදල් ගෙවීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම.

(2021 ඔක්තෝම්බර් මස සභාවේ හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා ගිය වියදම රු.73,510.00 )

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පසුගිය මාසයේ දී ZA 0228 ගිනි නිවන රථයේ හෝස් අලුත්වැඩියා කිරීම සඳහා තෙබුවන ගරාජය වෙත රුපියල් 25,070.00 ක මුදලකුත් එම වාහනය සඳහා 100AMP බැටරි 02 ක් ලබා ගැනීම වෙනුවෙන් චමින්ද බැටරි මාට් වෙත රුපියල් 48,440.00 ක මුදලකුත් වශයෙන් රුපියල් 73,510.00 ක මුදලක් වියදම් වූ බව පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06෴01෴09 2021-11-09 දින සිට 2021 දෙසැම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ යන්ත්‍ර සූත්‍රවල හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා රු.75,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

(2021 ඔක්තෝම්බර් මස සභාවේ යන්ත්‍ර සූත්‍රවල හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා වියදම් නොවුණි)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 2021 දෙසැම්බර් මස ගෙවිය යුතු දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය වාරිකය ලෙස රු.769,680.36 මුදලක් ද, වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය වාරිකය ලෙස රු.202,918.84 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 2021 නොවැම්බර් මාසය සඳහා කාර්යසාධන ණය රු. 800,000.00 කට යටත්ව ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ලක්ෂ 08 ක් පමණක් වෙන් කිරීමෙන් අසාධාරණයක් සිදු වන බව පැවසූ අතර, මෙම ගිණුමෙහි මේ වන විට ශේෂය කොපමණ පවතින්නේ දැයි විමසන ලදී.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, කාර්යසාධන ගිණුම වෙනම ක්‍රියාත්මක වන අතර, ඉන් සභාවට බලපෑමක් සිදු නොවන බව ද ගිණුම් ශේෂය අනුව මසකට කාර්යසාධන ණය රු. 800,000.00 කට යටත්ව ලබා දිය හැකි බවට ගණකාධිකාරීතුමා විසින් තහවුරු කළ පසුව ණය ඉල්ලීම් කර ඇති නාම ලැයිස්තුව පිළිවෙළට මෙම ණය ලබා දෙන අතර, හදිසි ආපදා අවස්ථාවක දී පමණක් ලැයිස්තුව නොසලකා ණය ලබා දෙන බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් කුමාරගම කෙත්තාරාම පන්සල දක්වා ඇති 2" නළ මාර්ගය මීටර 160 ක් දිගු කිරීම සඳහා මාර්ග උරහිස පළුදු කිරීම හා ගාස්තු නිදහස් කර දෙන ලෙස ඉල්ලා ඇති අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 බලන්ගොඩ නගර සභාව සතු තානායමේ ටෙන්ඩර් කාලය 2022-02-27 දිනෙන් අවසන් වන බැවින් නැවත ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, තානායම් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කාලය අවුරුදු 02 ක් දීර්ඝ කර දෙන ලෙස කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් සභාව විසින් තීරණයක් ගෙන ආණ්ඩුකාරතුමාට යොමු කළ නොහැකි දැයි විමසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් එසේ කිරීමෙන් සභාව හැල්ලුවකට ලක් වන බැවින් ටෙන්ඩර්කරුගේ ඉල්ලීම පිළිබඳව සානුකම්පිතව බලා පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සුදුසු බව පැවසීය.

06:01:14 නව බස්නැවතුම්පළ සී 53 කඩ කාමරය අබ්දුල් ලතීෂ් ජබ්බාර් යන අයට අයත්ව තිබූ අතර, ඔහු මිය ගිය බැවින් එම කඩ කාමරය ඔහුගේ බිරිඳ වන එම්. එච්. යූ. නිසායා යන අයට ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 බෝම්බුව නගර සභා පෙර පාසලේ දීමනා මත සේවය කළ කේ. රුවිනි නිරුක්ෂිකා මහත්මිය ඉල්ලා අස් වූ බැවින් එම පෙර පාසල සඳහා සුදුසු අයෙකු දීමනා මත යෙදවීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු සභාපතිතුමා, බළන්ගොඩ නගර සභාව මගින් පාලනය වන බෝම්බුව පෙර පාසලෙහි සේවා අවශ්‍යතාවය මත දීමනා පදනමින් සිංහල හා දෙමළ මාධ්‍ය වශයෙන් පෙර පාසල් පාලිකාවන් දෙදෙනෙකු සේවය කළ අතර, ඉන් සිංහල මාධ්‍ය පෙර පාසල් පාලිකාව වන කේ. රුවිනි නිරුක්ෂිකා යන අය 2021-10-26 දින ඉල්ලා අස් වූ බව ද මෙම ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් ජීවත් වන අතර, එම පවුල්වල දරුවන් හට මුදල් ගෙවා අධ්‍යාපනය ලබා දීමේ හැකියාවක් නොමැති බැවින් එම දරුවන් වෙත නොමිලේ සේවාව ලබා දීම මෙම පෙර පාසලෙන් සිදු කරන බව ද වසර ගණනාවක් පවත්වාගෙන ආ මෙම පෙර පාසලෙහි 2021-10-26 දින සිට සිංහල මාධ්‍ය පාලිකාවක් නොමැති වීම නිසා එම මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන දරුවන් හට යම් අසාධාරණයක් සිදු වන බැවින් හා පෙර පාසල අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සේවා අවශ්‍යතාවය මත දීමනා පදනමින් සුදුසුකම් සහිත අයෙකු පෙර පාසල් පාලිකා සේවයේ යොදවා ගැනීම අත්‍යවශ්‍ය බව ද මේ සඳහා අමතර මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමක් අවශ්‍ය නොවන අතර, ඉල්ලා අස් වූ පෙර පාසල් පාලිකාව වෙත ගෙවන ලද මාසික දීමනාව නව පෙර පාසල් පාලිකාව වෙත ලබා දීමට හැකි බව ද පැවසීය.

ඒ අනුව පෙර පාසල අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සේවා අවශ්‍යතාවය මත දීමනා පදනමින් සුදුසුකම් සහිත අයෙකු පෙර පාසල් පාලිකා සේවයේ යොදවා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 මහජන ක්‍රීඩාංගනය ආලෝකකරණය සඳහා අවශ්‍ය Sodium Daylight වෝට් 400 ධාරිතාවයෙන් යුක්ත බල්බ 40 ක් මිළ දී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:17 56-1906 දරණ කෘෘ කැබ් රථයේ AC පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 බළන්ගොඩ මහජන පුස්තකාලය සඳහා රු. 300,000.00 ක මුදල් සීමාවකට යටත්ව පොත් මිල දී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 2021 වර්ෂය තුළ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පුස්තකාලය වසා තැබීම නිසා එම වර්ෂය වෙනුවෙන් සාමාජිකත්වය ලබාගත් සහ සාමාජිකත්වය අලුත් කරනු ලැබූ පාඨකයන්ගේ සාමාජිකත්වය අය කිරීමකින් තොරව දීර්ඝ කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 බළන්ගොඩ නගර සභාව මඟින් 2018/2019, 2019/2020, 2020/2021 අධ්‍යයන වර්ෂ සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා ගැනීමට අයදුම්පත්‍ර භාර දුන් ශිෂ්‍යත්වලාභීන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, 2019/2020 , 2020 / 2021 අධ්‍යයන වර්ෂ වෙනුවෙන් විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා දීම සඳහා 6-5-473 ( i ) ශීර්ෂය යටතේ රු.150,000 /- ක මුදලක් වෙන් කර ඇති අතර එක් අයෙකුට රු.10,000 /- බැගින් අයදුම්කරුවන් 15 දෙනෙකු ඇතුලත්

කිරීමට හැකියාවක් පවතින බව ද නගර සභාව වෙත අයදුම්පත් ඉදිරිපත් කරන ලද විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගෙන් හා මේ වනවිට විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති පහත සඳහන් අයදුම්කරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්. ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

| අනු අංකය | නම | ලිපිනය | අධ්‍යයන වර්ෂය | විශ්ව විද්‍යාලය | පාඨමාලාව |
|---|---|---|---|---|---|
| 01 | එම්.එම්.පූර්ණි සංදීපා කුලරත්න | අංක 77, කුමාරගම. බලංගොඩ | 2019/2020 | රජරට විශ්ව විද්‍යාලය | ව්‍යවහාරික විද්‍යාව |
| 02 | ආර්. එම්. එස්.මධුෂානි රත්නායක | මස්සැන්න පාර, බෝම්බුව,බලංගොඩ | 2018/ 2019 | කොළඹ විශ්ව විද්‍යාලය | ජෛව පද්ධති තාක්ෂණය |
| 03 | ඒ. අයි. ෆාතිමා නිශ්රා | 91/බී, මිරිස්වත්ත, බලංගොඩ | 2019/2020 | අග්නිදිග විශ්ව විද්‍යාලය | ඉස්ලාම් අධ්‍යයනය |
| 04 | බී.බී.එස්. රශ්මික මධුරංග | නො.35, පරගහකුඹුර, බෝම්බුව, බලංගොඩ | 2019/2020 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | කළමණාකරණය |
| 05 | ඩබ්. සී. පාරින්දන ගුණරත්න | අරුණ, අනඳමෙත්ගම, පාර, කිරිදිගල, බලංගොඩ | 2019/2020 | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය | තේ තාක්ෂණය |
| 06 | ඩී.පී.ඩී.ඉමාෂි උදයංජලී සමරජීව | 151/බී/4, පිරිවෙන පාර, මිරිස්වත්ත බලංගොඩ | 2019/2020 | කැළණිය විශ්ව විද්‍යාලය | කළමණාකරණය |
| 07 | ඩී.එල්.එම්. බණ්ඩාර | නො.23/7, මුගුණමලේ පාර, බලංගොඩ | 2019/2020 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | විද්‍යා |
| 08 | ඩබ්. පී.පී. කෞෂික සමරසුන්දර | බණ්ඩාරවත්ත, මුගුණමලය, බලංගොඩ | 2019/2020 | සබරගමුව විශ්ව විද්‍යාලය | ඉංජිනේරු |
| 09 | මොහොමඩ් යාසීන් සජිත් | නො.49/3, තලාව පාර, දෙහිගස්තලාව, බලංගොඩ | 2018/ 2019 | කැළණිය විශ්ව විද්‍යාලය | පරිගණක තාක්ෂණය |
| 10 | ඩබ්. එම්. නෙත්මි පබසරා දිසානායක | 271/ඩී/16, රණවින්න ගම,කෝපිවත්ත පාර, තුඹගොඩ, බලංගොඩ | 2020/ 2021 | කැළණිය විශ්ව විද්‍යාලය | කලා |
| 11 | එල්.ඒ. සඳලි චාරුකා ලියනආරච්චි | නො.10 බී, සරස්වතී පාර, දෙහිගස්තලාව, බලංගොඩ | 2018/ 2019 | කැළණිය විශ්ව විද්‍යාලය | පරිගණක තාක්ෂණය |
| 12 | පී. ඊ. ඉසුරි උපාද්‍යා රත්නසේන | නො.15 ඒ/4, කරදියමුල්ල පාර, ඕඑගංතොට, බලංගොඩ | 2020/ 2021 | යාපනය විශ්ව විද්‍යාලය | ඉංජිනේරු |
| 13 | ඩබ්. එල්. චින්තන ජාලිය තිලකරත්න | 32/16,ගම ගෙදර පාර, ඕඑගංතොට, බලංගොඩ | 2020/2021 | ගම්පහ වික්‍රමාරච්චි විශ්ව විද්‍යාලය | සංචාරක කළමණාකරනය |

මෙහි දී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, නගර සභා අයවැය සම්මත වී නොමැති බැවින් ප්‍රාග්ධන වියදම් දැරීමට නොහැකි බව ද ජනවාරි මාසයේ දී මේ සම්බන්ධව තීරණය ගැනීම සුදුසු බව ද මීට පෙර අවස්ථාවල දී  අවුරුදු දෙක තුනක ගෙවීම් එකවර ගෙවා ඇති බව ද මෙම ශිෂ්‍යාධාර ලබා දීමේ ආරම්භකයා තමන් බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් ජනතාවගේ බදු මුදලින් සමාජයට සේවය කිරීම මහජන නියෝජිතයින්ගේ වගකීම බව ද තමන් හෝ පක්ෂයන් සමඟ පවතින භේදයන් නිසා දරුවන්ට අසාධාරණයන් සිදු කිරීම නොකළ යුතු බව ද මෙහි දී පූර්ව අනුමැතියක් ලබා ගැනීම පමණක් සිදු කරන බව ද පැවසීය.

මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා, විශ්ව විද්‍යාලය සඳහා තේරී පත්වන දරුවන්ව ඇගයීම සඳහා ලබා දෙන ශිෂ්‍යාධාරයක් වන බැවින් මේ සඳහා විරුද්ධ වීම නොකළ යුතු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 2021-11-09 දින විශ්‍රාම යාමට නියමිත ඩබ්. ඒ. සේනක මහතාගේ අනියම් ආදේශක කාලය ස්ථිර සේවා කාලයට එකතු කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදලෙන් සමුච්චිත අරමුදලෙහි තැන්පත් කළ 60% ක ප්‍රමාණය වන රු. 66,078.54 ක මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:22 2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම හා භාණ්ඩ සමීක්ෂණය අධීක්ෂණය සඳහා ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පත් කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, 2021 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවේ ප්‍රධාන කාර්යාලය, ගබඩාව, පෙර පාසල්, ආයුර්වේදය, ක්‍රීඩාගාරය, කොම්පෝස්ට් ව්‍යාපෘතිය, විදු නැණ පියස, සම්පත් පියස, ලේකම් නිල නිවස සහ මහජන පුස්තකාලය යන අංශවලට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම සඳහා පහත නම් සඳහන් සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම සුදුසු බවට යෝජනා කළ අතර, භාණ්ඩ සමීක්ෂණය අධීක්ෂණය සඳහා ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පත් කර ගන්නා ලෙස පවසන ලදී.

- සභාපති ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරි, ජී. ඩී. ඒ. සේමපාල මිය
- සාමාජික සංවර්ධන නිළධාරී, ඒ. රජිත කොස්වත්ත මයා
- සාමාජික සංවර්ධන නිළධාරී, සුජාතා නීලකාන්ති මිය
- සාමාජික සංවර්ධන නිළධාරි රසිකා ගුණසේකර මිය

- ❖ සාමාජික කළමනාකරණ සේවා නිළධාරි සජිත් ශානක මයා
- ❖ සාමාජික සංවර්ධන නිළධාරී, චතුලියා කල්හාරි දෙණිපිටිය මිය
- ❖ සාමාජික සංවර්ධන නිළධාරී,නයනී යසවර්ධන මිය
- ❖ සාමාජික කළමනාකරණ සේවා නිළධාරි නදීකා සුභාෂිනී මිය ,
- ❖ සාමාජික කළමනාකරණ සේවා නිළධාරි , ඩබ්. එස්. මෙනේරිවත්ත මිය
- ❖ සාමාජික සංවර්ධන නිළධාරි දීපා ප්‍රභාෂිණී රණසිංහ මිය
- ❖ සාමාජික සංවර්ධන නිළධාරි ඉදුනිල් ප්‍රියන්ත මයා
- ❖ සාමාජික පුස්තකාලායාධිපති හා පුස්තකාල කාර්යය මණ්ඩලය
- ❖ අධීක්ෂණය ගණකාධිකාරි, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා

ඒ අනුව ඉහත නම් සඳහන් සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

භාණ්ඩ සමීක්ෂණය අධීක්ෂණය සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සුදුසු බව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:23 පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021-10-26 දිනැති ලිපිය මඟින් බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළෙඳසැල අංක 09 හා 10 යන කඩ කාමර සම්බන්ධව නඩු තීන්දුව ලැබෙන තුරු අනෙකුත් මාළු කඩ කාමර ටෙන්ඩර් කරන ලෙස දන්වා ඇති අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා, මාළු කඩ ටෙන්ඩර් කිරීම තුළින් දිනපතා වෙළඳාමේ නිරත ව්‍යාපාරිකයන්ට අසාධාරණයක් වන බව ද ටෙන්ඩර් කිරීම දීර්ඝකාලීන සිදු කිරීමේ දී ගමේ ව්‍යාපාර කරනු ලබන පුද්ගලයා නොව පිටස්තර පුද්ගලයෙක් වෙත මෙම ව්‍යාපාරය හිමි විය හැකි බව ද මේ වන විට නඩු පවතින කඩ කාමරයන්හි පුද්ගලයන්ට පවා වෙනත් පිටස්තර පුද්ගලයෙකු යොදාගෙන මෙම කඩ ලබා ගත හැකි බව ද එසේ වුවහොත් ඒකාධිපති ව්‍යාපාරයක් වීමට බොහෝ විට ඉඩ ඇති බව ද පවසන ලදී. එමෙන්ම

තමන්ගේ මතය වන්නේ සියලුම කඩ කාමර එකවර ටෙන්ඩර් කිරීම සුදුසු බව වන අතර, කඩ කාමර සම්බන්ධ නඩුවක් පවතින අවස්ථාවේ ටෙන්ඩර් කිරීම තුළින් දීර්ඝකාලයක සිට ව්‍යාපාරයේ නිරත වන පුද්ගලයන්ට අසාධාරණයක් වන බවද ගරු සභාපතිතුමා හට නීත්‍යානුකූලව කටයුතු කිරීමට සිදු වුව ද දේශපාලන අධිකාරිය වශයෙන් ව්‍යාපාරිකයන් රැක ගැනීම යුතුකමක් වන බැවින් මේ සම්බන්ධව සභාවේ තීරණයක් ගෙන එය පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සුදුසු බව වැඩිදුරටත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මාළු කඩ සම්බන්ධව 1980 වර්ෂයේ නිකුත් කළ චක්‍රලේඛය අනුව එළවළු කඩ හා මාළු කඩ ටෙන්ඩර් කිරීම නැවතුණු අතර, ඒ වන විට රංමහත්තයා හා පියදාස මුදලාලි යන අය පොදු වෙළඳසැලෙහි සිටි බවද, අංක 18/19 කඩය අවුරුදු 20 කට වැඩි අතර, 1977 එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළ අවස්ථාවේ දී පියදාස මුදලාලි යන අය අවුරුදු ගණනාවක් ව්‍යාපාරය නොකර සිටි බව ද එම කාලයේ ප්‍රේමදාස මුදලාලි යන අය එළවළු විකිණූ බව ද අවුරුදු 50 කට පෙර තත්ත්වය තමන්ට පැවසීමට හැකි අතර, සුරංග යන අය මාළු වෙළඳාම කරන කෙනෙක් නොවුන ද මේ වන විට මාළු වෙළඳාමේ නිරත වන බවත් පවසන ලදී.

එමෙන්ම පියදාස මුදලාලි යන අය මිය ගිය අතර, අවුරුදු 20 ක් පමණ කඩ කාමරය සම්බන්ධයෙන් නඩුව පැවති බව ද එම අවුරුදු 20 තුළ පැවති නඩුවෙන් අලාභය අය කර ගැනීමට හැකි වුව ද සභාව නොපැවතීම හේතුවෙන් එම අලාභය අය කර ගැනීමට නොහැකි වූ බව ද ඉන් අනතුරුව ටෙන්ඩර් කිරීමට සූදානම් වන අවස්ථාවේ දී නැවත රීට් ආඥාවක් ලබා ගෙන ඇති බව ද මෙම රීට් ආඥාව කොමසාරිස්තුමාට විරුද්ධව ලබා ගෙන තිබුණු නමුත් ඔවුන් නඩු සඳහා සහභාගී වීම හා වියදම් කිරීම සිදු නොකරන බව ද මෙම අවස්ථාවේ කොමසාරිස්තුමා ටෙන්ඩර් කරන ලෙස ලිපියක් සභාවට යොමු කරන්නේ නම් එතුමා නඩුව සඳහා වියදම් කළ යුතු බව ද කොමසාරිස්තුමා මෙම නඩුව අවසන් කිරීමට කටයුතු කළ යුතු බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා මෙය මානව හිමිකම් යා හැකි ප්‍රශ්නයක් බව ද නඩුව සඳහා සභා මුදල් වියදම් කිරීමට ඉඩ නොදෙන බව ද පැවසීය.

තවදුරටත් අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා, නීතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් පොදු වෙළඳසැලෙහි කඩ කිහිපයක් වසා දමා ඇති අතර, අතුරු ව්‍යවස්ථාව අනුව නගර සීමාව තුළ එළවළු, මස් හා මාළු විකිණීම තහනම් වන බව ද එම අලෙවිසැල් වසා දමන්නේ නම් පොදු වෙළඳසැලෙහි වෙළඳාම් කටයුතු සිදු වන බව ද ටෙන්ඩර් කරන්නේ නම් කොමසාරිස්තුමා යොමු කළ චක්‍රලේඛය ඉවත් කරන ලෙස එතුමාට පවසන බව ද සඳහන් කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසුවේ පොදු වෙළඳසැල කඩ වැසී යාමට හේතුව වන්නේ හිටපු ගරු සභාපතිතුමා වන ඩබ්.එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් නව වෙළඳපළක් නිර්මාණය කිරීම බවයි. එමෙන්ම තමන් නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් 2011 වර්ෂයේ දී පත් වී පැමිණි කාලයේ දී මෙම කඩ සම්බන්ධව ගැටලුව පැවති අතර, එහි දී සීයයට ගණනක් වැඩිකර මෙම අයටම කඩ කරගෙන යාමට දුන් බව ද මේ නිසා එම කාලය ද භුක්ති විඳින ලද කාලයට එක් වී ඇති බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පළාත් සභා යටතට පළාත් පාලන ආයතන පවරා ඇති බැවින් එහි නිළධාරී කණ්ඩායමක් විසින් පළාත් පාලන ආයතන මෙහෙයවීම හා අධීක්ෂණය සිදු කරන බව ද සභාව විසින් නිවැරදි තීරණ නොගෙන රජයේ ආදායම අවහිර කරගෙන ඇති බව සලකා රජයේ ආදායම වැඩි කර ගැනීම සඳහා මෙසේ උපදෙස් ලබා දී ඇති බව ද රජයේ ආදායම කපා හැරීමට සභාවට නොහැකි අතර, එවැනි තීරණයක් ගන්නේ නම් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගත යුතු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසුවේ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා සහ වත්මන් ගරු සභාපතිතුමා යන දෙදෙනාම පවසන දේ සත්‍ය වන අතර, ගන්නා වූ තීරණය මානුෂික තීරණයක් වුව ද මෙහි විශාල අවදානමක් සියලුම දෙනාට පවතින බවත්, මෙම නඩුව පවත්වාගෙන යන අය විසින් නඩුව අත් නොහරින අතර, නැවත නැවත මෙය අඛණ්ඩව පවත්වාගෙන යාමට උත්සාහ කරන බවත්, මේ නිසා සභාව විසින් ගන්නා ලද තීරණය අලුත් වෙමින් යා හැකි වන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මෙහි දී දෙදෙනෙක් නිසා තවත් පස් දෙනෙකුට අසාධාරණයක් වන බව ද ජනතා නියෝජිතයින් වශයෙන් ජනතාව වෙනුවෙන් වැඩ කළ යුතු බව ද ටෙන්ඩර් කිරීමට විරුද්ධ බව ද පවසන ලදී.

මෙහි දී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය, අංක 09 හා 10 කඩ දෙක හැරුණු විට විවෘතව පවතින්නේ එක් කඩයක් පමණක් බැවින් ඔහුට අසාධාරණයක් වන අතර, ඒ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා හා පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කරන ලෙස පවසන ලදී.

මෙහි දී අදහස් දෙකක් ඉදිරිපත් වීම නිසා 06:01:23 බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළෙඳසැල අංක 09 හා 10 යන කඩ කාමර සම්බන්ධ නඩු තීන්දුව ලැබෙන තුරු අනෙකුත් මාලු කඩ ටෙන්ඩර් කිරීමේ යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී 06:01:23 යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් දෙදෙනෙකුද, එනම්,

| | |
|---|---|
| 01. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී.පේමදාස මැතිතුමා ද |

ඒ සඳහා විපක්ෂව ගරු සභිකවරුන් දහතුන් දෙනෙකුද, එනම්,

| | |
|---|---|
| 01. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමී මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |

06. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

07. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

08. ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය

09. ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා

10. ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය

11. ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය

12. ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය

13. ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද

ඡන්දය ප්‍රකාශ කළ අතර,

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා සභාවට නොපැමිණි ගරු සභිකයින් වේ.

ඒ අනුව 06ඃ01ඃ23 යෝජනාව වැඩි ඡන්ද එකොළහකින් පරාජයට පත් වූ බැවින් සභා සම්මත නොවීය.

මෙහි දී අදහස් දක්වූ ගරු සභාපතිතුමා නාගරික සංවර්ධන අධිකාරියේ නව නගර සැලැස්මට අනුකූල නොවන පරිදි මහජන පොළ භූමිය ආශ්‍රිතව නව වෙළඳපොළක් හිටපු ගරු සභාපති වන ඩබ්.එම්. එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් නිර්මාණය කර, තම ඥාති හිතෛෂීන් වෙත එහි කඩ කාමර ලබා දුන් බව ද පොදු වෙළඳපොළ කඩ කාමරවල සිටි ඇතැම් වෙළෙන්ඳන් නව වෙළඳපොළෙහි වෙළඳාම් සිදු කිරීමට පෙළඹීම හා බස්නැවතුම්පළ ආසන්නයේ ස්ථානයක් වීම නිසා මගී ජනතාව වැඩි වශයෙන් එම වෙළඳ ස්ථානයට යාමට පෙළඹීම යන හේතූන් මත පොදු වෙළඳසැල කඩ කාමර වැසී යාමේ තත්ත්වයක් උදා වී ඇති බව ද සුරංග යන පුද්ගලයා හිටපු සභාපතිවරයාගේ ඥාති පුත්‍රයෙක් වන අතර, ඔහුව බළන්ගොඩට ගෙන විත් මාළු වෙළඳාම සඳහා යොමු කරනු ලැබුවේ එතුමා මිස වෙනත් පුද්ගලයෙකු නොවන බව ද පවසන ලදී.

06:01:24 නගර සභාව සතු පහත සඳහන් කඩ කාමර සම්බන්ධයෙන් බදුකරුවන් සමඟ ඇති කරගන්නා ලද බදු ගිවිසුම 2021-12-31 දිනෙන් අවසන් වන බැවින් 2022 වර්ෂයේ නව ගිවිසුම් කෙටුම්පත් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- නව බස් නැවතුම්පළ කඩ කාමර
- කාර් පාර්ක් කඩ කාමර
- සාප්පු කඩ කාමර
- පොදු වෙළඳසැල එළවළු හා සිල්ලර කඩ කාමර
- බස් නැවතුම්පළ යාබද ඉඩම් කොටස (පදික) කඩ කාමර
- මැණික් කඩ කාමර
- බස්නැවතුම්පළ යාබද ඉඩම් කොටස (නව පදික) කඩ කාමර
- මහජන පොළ කඩ කාමර/පොළ කඩ කාමර/පොළ ගබඩා

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:25 227-5020 දරණ ගලි බවුසරයේ AC පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:26 ZA 9835 දරණ ගලි බවුසරයේ දැනට පවතින කොම්ප්‍රෙෂර් එක වෙනුවට වෙනත් කොම්ප්‍රෙෂර් එකක් යෙදීම, අඟල් 02 බටයක් දැමීම හා ඔයිල් ටැංකිය, P.T.O සාෆ්ට් එක, ඉන් අවුට් කරාමේ පුලියේ රේසර් දෙකක් දැමීම, ඕෆ්ලෝ ටැංකිය යන අමතර කොටස් වෙනස් කර, වාහනය අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:27 කාර්යසාධන ණය පියවීම සඳහා වැඩිපුර අය වී ඇති වාරික මුදල් වන රු. 7,017.00 ක මුදල නැවත අනුලා කහංගම මිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:28 බළන්ගොඩ, රත්නපුර පාර වරිපනම් අංක 217/17 ලේකම් නිල නිවාසයේ කුලිය රු.2,000.00 දක්වා වැඩි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:29 බළන්ගොඩ නගර සභාව මඟින් පාලනය වන බෝම්බුව, වැවවත්ත හා නගර සභා පෙර පාසල් දරුවන් සඳහා සහතික පත්‍ර 100 ක් හා ත්‍යාග 100 ක් ලබා දීම වෙනුවෙන් රු.75,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:30 නගර සභාව සතු පොදු වෙළෙඳසැල මාළු කඩ කාමර තක්සේරු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:31 2021 නොවැම්බර් මස කර්මාන්ත අංශය මඟින් සිදුකිරීමට අපේක්ෂිත පහත සඳහන් නඩත්තු සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- බළන්ගොඩ පොදු වෙළෙඳසැලේ වහලය නඩත්තු කිරීම.
- පරගහකුඹුර මාර්ගය ඉතිරි කොටස තාර දැමීම

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය**

දිනකට සේවකයන් 15 බැගින් දින 25 කට කම්කරුවන් 375ක් අවශ්‍ය වේ.

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය රථවාහන**

| | |
|---|---|
| ටිපර් රථය | දින 25 |
| ට්‍රැක්ටර් රථය | දින 25 |
| D/D රෝල | දින 15 |
| JCB යන්ත්‍රය | පැය 50 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා, පරගහකුඹුර මාර්ගය අවසානයේ පවතින බෝක්කුව අවහිර වන බැවින් එම අවහිරතාවය ඉවත් කර දෙන ලෙස පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:32 සභාවේ නීති කටයුතු සඳහා නීතිඥවරියක වන එස්. ඒ. තුෂාරි සංජීවනී සූරියආරච්චි යන අය පත් කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:33 ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන ග්‍රාමීය මාර්ග සංවර්ධනය වැඩසටහන යටතේ පල්ලෙවෙල වෙල අද්දර මාර්ගය සංවර්ධනය කිරීම හා බුලත්ගම බෝධිය අසල මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහා වැවවත්ත ප්‍රජා එකමුතු සංවිධානය වෙත ලබා දීමට 2021-10-18 දිනැති මහ සභාවේ දී අනුමත වූ අතර, එම සමිතියේ ගිණුමෙහි ප්‍රමාණවත් ශේෂයක් නොමැති බැවින් හැකියා සහතිකයක් ලබා ගැනීමට නොහැකි වූ නිසා එම මාර්ගයන් සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත් කටයුත්ත තුඹගොඩ සුබ සරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය වෙත ලබා දීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:34 ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන ග්‍රාමීය මාර්ග සංවර්ධනය වැඩසටහන යටතේ, ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති යෝජනා සංශෝධනය කර, යෝජිත නව ව්‍යාපෘති සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| ව්‍යාපෘති අංකය | සංශෝධනය කළ යුතු ව්‍යාපෘතිය | යෝජිත නව ව්‍යාපෘතිය |
|---|---|---|
| LA/24/21/CC/1855 | හුණු කුඹුර දෙල්ගස්වත්ත මාර්ගයේ සෙල්ව කුමාර මහතාගේ නිවස පිටුපස මාර්ගය සංවර්ධනය කිරීම | බානගල මහතාගේ නිවස අසල සිට කරුණාවතී මහත්මියගේ නිවස දක්වා වූ මාර්ග කොන්ක්‍රීට් කිරීම |
| LA/24/21/CC/1856 | ඉක්බාල් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | දෙහිගස්තලාව ක්‍රිස්තියානි දේවස්ථානයට පහළ ඇති හිල්මා ග්‍රොසරි අසලින් පහළට ඇති අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම |
| LA/24/21/CC/1851 | මුගුණමලේ ඉත්තෑගලහේන මාර්ගය සංවර්ධනය කිරීම | කිරිදිගල මුගුණමලේ බණ්ඩාරවත්ත මාර්ගය සංවර්ධනය කිරීම |
| LA/24/21/CC/1852 | කිරිදිගල දේගපිටිය මාර්ගය | කිරිදිගල මුගුණමලේ |

| | | |
|---|---|---|
| | සංවර්ධනය කිරීම | ගලපල්ලේඅරාව මාර්ගය සංවර්ධනය |
| LA/24/21/CC/1857 | බෝම්බුව අමුණ මාර්ගය | වෑ කුඹුර දෙහිපිටිය වෙද ගෙදර දක්වා මාර්ගය සංවර්ධනය |
| LA/24/21/CC/1846 | තලංගම යක්එරමුදුකැටිය නිමල් කඩේ අසල මාර්ගය සංවර්ධනය කිරීම | තලංගම සමූපකාර ඉදිරියෙන් වේ ගඟ දෙසට ඇති දෙවට මාර්ගය සංවර්ධනය කිරීම |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:35 ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ග්‍රාමීය මාර්ග සංවර්ධනය වැඩසටහන යටතේ පහත සඳහන් මාර්ග සංවර්ධනයන් සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

I. ඊ. එල්. ප්‍රනාන්දු මහතාගේ නිවස අසල සිට සාදින් මාස්ටර්ගේ නිවස පසුකර සේනක පෙදෙස දක්වා සංවර්ධනය කිරීම
II. සඳුන්ගම පළමු අතුරු මාර්ගය සංවර්ධනය කිරීම
III. කුමාරගම පිරිවෙන මාර්ගයේ සුගතදාස නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම
IV. කිරිදිගල චමින්ද නාරංගොඩ මහතාගේ නිවස දක්වා වන මාර්ගය සංවර්ධනය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මිල ගණන් අනුමත කිරීම**

07:01 පහත සඳහන් ද්‍රව්‍ය මිළ දී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුමත කර ගැනීම

| | විස්තරය | ආයතනය | ප්‍රමාණය | ඒකක මිල (රු) |
|---|---|---|---|---|
| 07:01:01 | බෝල් පොයින්ට් පෑන් (ඇට්ලස්) | ජෝති ස්ටෝර්ස් | 500 | 12.00 |
| 07:01:02 | ඉදල් (හෙවි) | ජෝති ස්ටෝර්ස් | 100 | 190.00 |
| 07:01:03 | ෆයිල් ටැග් | නිව් ජෝති ස්ටෝර්ස් | 1000 | 1.35 |
| 07:01:04 | මිනි සබන් | ජෝති ස්ටෝර්ස් | 500 | 12.00 |

| | | | | |
|---|---|---|---|---|
| 07:01:05 | A 4 තැඹිලි පාට | ජෝති ස්ටෝර්ස් | බන්ඩල් 01 | 1300.00 |
| 07:01:06 | මකන | ජෝති ස්ටෝර්ස් / නිව් ජෝති | 20 | 8.50 |
| 07:01:07 | A 3 | ජෝති ස්ටෝර්ස් | 03 | 1500.00 |
| 07:01:08 | ස්ටෙප්ලර් කටු | ජෝති ස්ටෝර්ස් | පැකට් 50 | 32.50 |
| 07:01:09 | පේපර් ක්ලිප් | ජෝති ස්ටෝර්ස් | පැකට් 50 | 32.50 |
| 07:01:10 | ෆයිනෝල් ලීටර් 4 | ජෝති ස්ටෝර්ස්/නිව් ජෝති ස්ටෝර්ස් | 50 | ලීටර් 01 - රු. 560.00 |
| 07:01:11 | කොහු ප්ලාස්ටික් | ජෝති ස්ටෝර්ස්/නිව් ජෝති ස්ටොර්ස් | 24 | 175.00 |
| 07:01:12 | වැසිකිළි සෝදන බ්‍රෂ් | ජෝති ස්ටෝර්ස් | 12 | 120.00 |
| 07:01:13 | කාණු බ්‍රෂ් | ජෝති ස්ටෝර්ස් | 24 | 170.00 |
| 07:01:14 | මොබ් | ජෝති ස්ටෝර්ස් | 10 | 275.00 |
| 07:01:15 | වයිෆර් | ජෝති ස්ටෝර්ස් | 05 | 235.00 |
| 07:01:16 | ග්ලවුස් රෙදි මිශ්‍ර | ජෝති ස්ටෝර්ස් | 100 | 140.00 |
| 07:01:17 | ගාබේජ් බෑග් | ජෝති ස්ටෝර්ස් | 1100 | 8.75 |
| 07:01:18 | ටාපෝලින් | නිව් ජෝති ස්ටෝර්ස් | මීටර් 50 | මීටර් 01 - 160 |
| 07:01:19 | ග්ලාස් ක්ලිනර් | ජෝති ස්ටෝර්ස්/නිව් ජෝති | 10 | 220.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:02 සැනිටයිසර් හා මාස්ක් මිළ දී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුමත කර ගැනීම

| | **අයිතමය** | **ප්‍රමාණය** | **ආයතනය** | **ඒකක මිළ රු.** |
|---|---|---|---|---|
| 07:02:01 | සැනිටයිසර් | ලීටර් 5 කෑන් 10 | හයිජින් ලංකා | ලීටර් 5 = 2500.00 |
| 07:02:02 | මාස්ක් සර්ජිකල් | පෙට්ටි 10 | ජෙයා එන්ටප්‍රයිසර් | පෙට්ටි 01 375.00 |
| 07:02:03 | මාස්ක් K 95 (කලු හා සුදු) | 100 | හයිජින් ලංකා /ජෙයා එන්ටප්‍රයිසර්<br><br>හයිජින් ලංකා | 25.00 සුදු<br><br>28.00 කලු |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:03 මුද්‍රිත ආකෘති හා පෝරම කට්ටල මිළ දී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුමත කර ගැනීම

| | **අයිතමය** | **ප්‍රමාණය** | **ආයතනය** | **ඒකක මිළ රු.** |
|---|---|---|---|---|
| 07:03:01 | මුද්‍රිත ලියුම් කවර | 5000 | සීගිරි ප්‍රින්ටර්ස් | 5.25 |
| 07:03:02 | බිම් කට්ටි අයදුම්පත් | 1000 | සීගිරි ප්‍රින්ටර්ස් කරුණාරත්න ප්‍රින්ටර්ස් | 18.00 |
| 07:03:03 | ගොඩනැගිලි අයදුම්පත් | 1000 | සීගිරි ප්‍රින්ටර්ස් කරුණාරත්න ප්‍රින්ටර්ස් | 24.00 |
| 07:03:04 | ලිපි ශීර්ෂ | 2000 | කරුණාරත්න ප්‍රින්ටර්ස් | 25.00 |
| 07:03:05 | ඉන්ධන අයදුම්පත් | 1000 | කරුණාරත්න ප්‍රින්ටර්ස් | 3.00 |
| 07:03:06 | ATD | 1000 | සීගිරි ප්‍රින්ටර්ස් කරුණාරත්න ප්‍රින්ටර්ස් | 15.00 |
| 07:03:07 | බලපත්‍ර කාලය දීර්ඝ කිරීමේ අයදුම්පත් | 500 | සීගිරි ප්‍රින්ටර්ස් කරුණාරත්න ප්‍රින්ටර්ස් | 3.00 |
| 07:03:08 | අනුකූලතා සහතික | 500 | සීගිරි ප්‍රින්ටර්ස් | 5.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:04 බල්බ් මිළ දී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුමත කර ගැනීම

07:04:01 වොට් 12 පින් වර්ගයේ බල්බ 50 ක් ශක්ති එන්ටප්‍රයිසස් වෙතින් මිළ දී ගැනීම (ඒකක මිල 488.00)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:05 ZA 5039 දරණ ජේසීබී යන්ත්‍රයේ මාස්ටර් පොම්පයෙහි බ්‍රේක් ඔෂර් දැමීම, ස්ටිරින් බොක්ස් එක ගලවා රේසර් හා ඔයිල් සීල් දැමීම, කැබ් එකෙහි දොර කැඩුණු ස්ථානයේ තහඩු කැබැල්ලක් රිවට්

කිරීම යන අලුත්වැඩියා සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු. 16,550.00 ක මිල ගණන් අනුමත කර අදාල සේවාව ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:06 අනතුරුදායක ගස් කපා බිම හෙළීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුමත කර ගැනීම

07:06:01 මුගුණමලේ අඹ ගස කපා බිම හෙළීම වෙනුවෙන් අවම මිළ වන රු. 14,600.00 ක මුදල ඉදිරිපත් කර ඇති ඒ. අනුර මහීලාල් යන අයගෙන් ලැබී ඇති මිළ ගණන අනුමත කර ගැනීම

07:06:02 බෝම්බුව ප්‍රදේශයේ ඇති මැහෝගනී ගසක්, කැන්ද ගසක්, රුක් අත්තන ගසක් හා කොස් ගසක අඩක් කපා බිම හෙළීම වෙනුවෙන් අවම මිළ වන රු. 48,500.00 ක මුදල ඉදිරිපත් කර ඇති ඒ. අනුර මහීලාල් යන අයගෙන් ලැබී ඇති මිළ ගණන අනුමත කර ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, 07:06:02 යටතේ ඇති ගස් සභාව විසින් කපා බිම හෙළීමට කටයුතු කරන්නේ අදාල පුද්ගලයන් එම ගස් කපා ගත නොහැකි බව පවසන නිසා දැයි විමසන ලදී.

මේ සම්බන්ධව වැඩ අධිකාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. මන්ත්‍රී යෝජනා**

**08:01 ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

08:01:01 උඩකන්ද පාර විදුලි බුබුලු සවි කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මේ සම්බන්ධව පරීක්ෂා කර බලා වාර්තා කරන ලෙස වැඩ අධිකාරීතුමා හට පැවසීය.

මෙහි දී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, වීරසුන්දරාරාම හන්දිය සඳහා විදුලි බුබුලක් සවි කර දෙන ලෙස පැවසූ අතර, ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ඇල්ලෙපොල, රුසිරු ලී මඩු වෙළඳසැල පවතින ස්ථානයට පහළින් විදුලි බුබුලු නොමැති වීම නිසා අඳුරු වී ඇති බව ප්‍රදේශවාසීන් පවසන බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 08:02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

08:02:01 දීර්ඝ කාලයක් නගර සභාවේ සේවය කර, අධ්‍යාපන සුදුසුකම් නොමැතිවීම මත සේවය ස්ථිර කර ගැනීමට නොහැකි වූ සෞඛ්‍ය කම්කරුවන්ගේ සේවය ස්ථිර කර කිරීමට අවශ්‍ය පියවර ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, අවුරුදු 15 කට වැඩි කාලයක් නගර සභාවේ සේවය කර, අධ්‍යාපන සුදුසුකම් නොමැතිවීම මත සේවය ස්ථිර කර ගැනීමට නොහැකි වූ සෞඛ්‍ය කම්කරුවන් සඳහා ප්‍රධාන අමාත්‍යාංශය විසින් සති දෙකක පුහුණුවක් ලබා දී සේවයේ ස්ථිර කිරීම සිදු කරන ලෙස යෝජනාවක්, බළන්ගොඩ සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කරන ලෙස ද මෙම සෞඛ්‍ය කම්කරුවන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය කරන අතර, ඔවුන් සේවයෙන් ඉවත් වුවහොත් මේ සඳහා වෙනත් පුද්ගලයන් ඉදිරිපත් නොවන බව ද පැවසීය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පැවසූවේ මේ සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 08:03 ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය

**(කර්මාන්ත කමිටුව විසින් නිර්දේශිත යෝජනා)**

08:03:01 හුණුකුඹුර දෙල්ගස්වත්ත මාර්ගයේ මුස්ලිම් නිවස ඉදිරිපිට බෝක්කුව සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති බැවින් බෝක්කුව සුද්ධ කිරිම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:04 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

**(කර්මාන්ත කමිටුව විසින් නිර්දේශිත යෝජනා)**

08:04:01 "කාර්පාර්ක්" ඉදිරිපිට "බුහාරි හෝටලය" අසල පදිකයින් ගමන් ගන්නා කොටස මට්ටම් කර පදිකයින් ගමන්ගන්නා හංදිය නඩත්තු කරදීම.

08:04:02 කුමාර විද්‍යාලය ඉදිරිපිට මාර්ගයේ පවතින වල පිළිසකර කිරීම.(පාසල් පටන්ගෙන කුඩා ළමුන් ගැවසීම හේතුවෙන්)

08:04:03 මහජන පොළ වැසිකිලිය නැවතත් යථා තත්ත්වයට පත්කර ජනතාවට භාවිතා කළ හැකි අයුරින් නඩත්තු කරදීම.

08:04:04 "සිරි වීරසුන්දරාරාම" මාවත පටන් ගන්නා තැන පල්ලිය හංදියේ පවතින ගැඹුරු කාණුව පදිකයින් කාණුවට නොවැටෙන ආකාරයට කොන්ක්‍රීට් තහඩු ආවරණය කර නඩත්තු කරදීම.

08:04:05 එම හංදිය ඉදිරිපිට "හැමිල්ටන්" මහතාගේ ගොඩනැගිල්ල ඉදිරිපිට හංදියේ වාහන නැවැත්වීම වැළැක්වීමට පියවර ගැනීම.(බිම දමා ඇති විදුලි කණුව ඉවත් කර)

08:04:06 හෝරා ස්ථම්භය අසල සමුරජිණ ගොඩනැගිල්ල ඉදිරිපිට ඇති මුල් කොටස කැඩී බිඳී ඇති අතර, කොන්ක්‍රීට් තහඩු දෙකක් යොදා නඩත්තු කරදීම.

08:04:07 කල්තොට පාරේ "ජුම්මා දේවස්ථානය" අසල සිට කිරි මණ්ඩලය දක්වා මාර්ගය අයිනේ ඇති කඩා වැටුණු කොන්ක්‍රීට් තහඩු ඉවත් කොට වෛද්‍ය රෆයිදීන් මහතාගේ ඉංග්‍රීසි බෙහෙත්හල අවට ජනයා රැස්වන බැවින් කොන්ක්‍රීට් තහඩු යොදා මාර්ගය පිළිසකර කරදෙන මෙන් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ලිපියක් යැවීම.

08:04:08 ඇවිදින මංතීරුවට සමාන්තරව තිබූ විකල්ප මාර්ගයට වැටී ඇති පස් ඉවත් කොට මාර්ගය නඩත්තු කරදීම

08:04:09 කරව්කැටිය වටරවුම් පාරේ 05 වන පටුමග දෙපස පිළිසකර කරදීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**10. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

මෙහි දී අදහස් දක්‌ වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජේ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, නිරෝධායන ඇඳිරිනීතිය පනවා තිබූ කාල සීමාව සඳහා කඩ කුලී අය නොකිරීමට සභාව විසින් තීරණය කර තිබුණ නමුත් දඩ කුලී සමඟ කඩ කුලී ලබා ගෙන ඇති බවට වෙළඳ ව්‍යාපාරිකයන් දැනුම් දුන් බව ද එසේ ලබාගෙන ඇත්නම් එය වැරැද්දක් බව ද පවසන ලදී.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, කඩ කුලී ගෙවීම සඳහා ඔක්තෝම්බර් මස 31 වන දින දක්වා කල් ලබා දී තිබුණු අතර, එම කාලය තුළ නොගෙවූ අය සඳහා දඩ කුලී අය කර ගෙන ඇති බව ද ගැටලු පවතින වෙළඳ ව්‍යාපාරිකයන්ට ඒ සම්බන්ධව ඉල්ලීමක් කරන ලෙස ද පැවසීය.

**2021-10-01 සිට 2021-10-31 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 8,497,056.88 |
| වෙනත් ලැබීම් | 1,989,707.15 |
| මුලු ලැබීම් | 10,486,764.03 |
| පුනරාවර්තන වියදම් | 8,787,590.26 |
| වෙනත් වියදම් | 2,156,691.45 |
| මුලු වියදම් | 10,944,281.71 |

**2021-10-01 සිට 2021-10-31 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 10,656.00 |
| 227-5020 | 48,574.00 |
| RD - 8240 | 37,062.90 |
| 226-7521 | 6,549.00 |
| BC-0005 | 22,200.00 |
| CSM 0009 | 1,256.00 |
| GC 0001 | 5,338.00 |
| HF7899 | 41,325.00 |
| | 13,600.00 |
| ZA 5039 | 8,880.00 |
| LL - 7688 | 5,550.00 |
| JD-4684 | 3,611.00 |
| LL-2110 | 8,188.00 |
| | 385.00 |
| | 100.00 |
| ND-5124 | 35,632.11 |
| PF-4006 | 31,498.56 |
| QL-2901 | 3,768.00 |
| RC-1107 | 30,065.80 |
| | 2,504.00 |
| RD 8000 | 21,921.00 |
| RE 2600 | 20,346.00 |
| RC8183 | 3,219.00 |
| 37-7933 | 3,005.00 |
| HF 8558 | 3,552.00 |
| SDRR0013 | 555.00 |
| VI 1833 | 1,256.00 |
| RB 4786 | 12,350.00 |
| RC 1118 | 16,650.00 |
| ZA0228 | 6,105.00 |
| UQ 1933 | 3,140.00 |
| **එකතුව** | **408,842.37** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**11. ඇස්තමේන්තු අනුමත කිරීම**

11:01 **ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

11:01:01 පරගහකුඹුර වතුකාරගොඩ මාර්ගය නඩත්තු කිරීම සඳහා ඇස්තමේන්තු මුදල - රු. 390,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව කාර්මික නිළධාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**12. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව නිරෝගී පරපුරක් බිහි කිරීමේ අරමුණින් රසායනික පොහොරවලින් තොර කෘෂිකර්මාන්තයක් ඇති කිරීම සඳහා කාබනික පොහොර මඟින් වගා කිරීමට ගොවීන්ට උපදෙස් ලබා දෙන අතර, මේ නිසා කාබනික පොහොර නිෂ්පාදකයන් සඳහා ස්වයං රැකියා බිහි කිරීමට ද බෝගයන් සඳහා විදේශව ඉහළ මිලක් ලබා ගැනීමට හැකි වන බව ද විදේශ සංචාරකයන් රටට ගෙන්වා ගැනීමට රුකුලක් වන බව ද එබැවින් මෙම අවස්ථාවේ රජය ගෙන ඇති දිගු කාලීන වැඩ පිළිවෙලට සහය දිය යුතු බව ද පවසන ලදී. එමෙන්ම රජය මේ වන විට නැනෝ නයිට්‍රජන් පොහොර රටේ සියලු ප්‍රදේශවලට බෙදා දෙන බව ද පසුගිය දිනක රටේ නව මංමාවත් 1500 ක් විවෘත කළ අතර, රජයේ සංවර්ධන වැඩපිළිවෙල මඟින් නොනවත්වා රට ඉදිරියට යමින් පවතින බව ද කොරෝනා වසංගතය පාලනය කර, දීර්ඝ කාලයකට පසුව දරුවන් පාසල් යාම ආරම්භ කර ඇති බව ද මෙම මොහොතේ අප කළ යුත්තේ රජයේ ඉදිරි කටයුතුවලට සහය ලබා දීම බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ඇල්ලෙපොල අනතුරුදායක පොල් ගසක් සම්බන්ධයෙන් සභා වාර කිහිපයක දීම පැවසුව අතර, මේ වන තෙක් එය ඉවත් කර නොමැති බව ද බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෙළීමේ බලපත්‍රය ගැන විමසූ අවස්ථාවේ දී බලපත්‍රය ලබා දීමට හැකි බව පැවසූ නමුත් එය නගර සභාවට එවා නොමැති බවට විෂය නිළධාරී පවසන බව ද හෙළීමේ බලපත්‍රය සභාවට නොලැබුණේ නම් ඒ සම්බන්ධව සොයා බැලීමක් නොකරන්නේදැයි විමසූ ගරු

නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය, අනතුරුදායක තත්ත්වය ගැන සලකා මෙම ගස ඉවත් කිරීමට අවධානය යොමු කරන ලෙස පවසන ලදී.

එමෙන්ම දෙල්ගස්වත්ත මාර්ගයේ පවතින විශාල බැම්මක් යට කොටසෙහි නිවාස දෙකකට ඇල වී ඇති අතර, උඩ කොටසෙහි පිහිටා ඇති නිවසෙහි හිමිකරුවන් විසින් රු. 7,000.00 ක පමණ වියදමකින් ඉටිරෙදි ආවරණයක් බැම්ම සඳහා යොදා තිබුණ ද මේ වන විට එම ඉටිරෙදි විනාශ වී ගොස් ඇති බව ද පවතින දැඩි වර්ෂාව හේතුවෙන් අනතුරුදායක තත්ත්වය නැවතත් ඇති වී ඇති බැවින් හැකියාවක් ඇත්නම් ඉටි රෙදි මීටර් 100-200 ක් ඔවුන් හට ලබා දීමට ගරු සභාවට තමන් මෙහි දී යෝජනා කරන බව ද ඒ පිළිබඳව ඔවුන්ගේ දැඩි ඉල්ලීමක් පවතින බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය, මෙම බැම්ම ඉදිකිරීම සම්බන්ධව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා හරහා යොමු කර ඇති අතර, ඇස්තමේන්තු සකස් කරමින් පවතින බව පවසන නමුත් ඉදිකිරීම් කටයුතු මාස 07 ක් හෝ 08 ක් ප්‍රමාද විය හැකි බව ද වැඩිදුරටත් පැවසීය.

මීට අමතරව පවතින දැඩි වර්ෂාව හේතුවෙන් ඩෙංගු අවදානම වැඩි වී ඇති බැවින් මදුරුවන් බෝ වන ස්ථාන සඳහා ධූමායනය සිදු කර දෙන ලෙස පවසන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් ඩෙංගු රෝගී වාර්තා අනුව ධූමායනය කිරීම හෝ නොකිරීම තීරණය කරන බව ද අනතුරුදායක පොල් ගස ඉවත් කිරීමේ කටයුතු කඩිනමින් සිදු කරන ලෙස වැඩ අධිකාරීතුමාට පවසන අතර, අනතුරුදායක බැම්ම සම්බන්ධයෙන් සොයා බලන බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් අනඳමෙත්ගම සිට පන්සල දක්වා මාර්ගය කාපට් කර ඇති නමුත් එහි අඩුපාඩු දෙකක් පවතින බව ද එක් අඩුපාඩුවක් වන්නේ නන්දන කඩය අසල කාණුවක් නොයෙදීම නිසා මාර්ගයේ ජලය ගලා ගෙන යාම වන අතර, අනෙක් අඩුපාඩුව වන්නේ සමරසිංහ මහතාගේ නිවස අසල පස් පාරේ ඉතිරි වී ඇති මීටර් 50 ක් පමණ වන කොටස සඳහා තාර දැමීම බව ද මෙම අඩුපාඩු සකස් කර දෙන ලෙස සභාව විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලිපියක් යොමු කරන ලෙස ද එම මාර්ගයේ තිබෙන ලොකුම ගැටලුව වන්නේ මාර්ගයේ සිට ගලා එන ජලය මඟින් අනික් පැත්තෙහි මාර්ගය යට වීම වන බැවින් එය වළක්වාලීමට පියවරක් ගන්නා ලෙස ද මාර්ගයන්හි තැනින් තැන කැඩුණු කොන්ක්‍රීට් කොටස් පවතින බැවින් එම මාර්ග පිළිසකර දෙන ලෙස ද පවසන ලදී.

මීට අමතරව මුගුණමල පාරේ දඹගහ නිවස අසල, අනඳමෙත්ගම පළමු පටුමගෙහි බණ්ඩාරවත්ත මහතාගේ නිවසට යාබද නිවස අසල, රෝහිණී මහත්මියගේ නිවස අසල සහ බුද්ධ ජයන්ති පාරේ නීටා මහත්මියගේ නිවස ඉදිරිපිට යන ස්ථාන කිහිපයෙහි දිරා ගිය විදුලි කණු කිහිපයක් පවතින අතර, ඒ සම්බන්ධව සභාව මඟින් විදුලි බල මණ්ඩලය දැනුවත් කරන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් අසනීප තත්ත්වයේ පසුවන ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බව ද මාධ්‍යවේදී එස්. රාමර් මහතාගේ අභාවය සම්බන්ධව ශෝකය පළ කරන බව ද එතුමා දෙමළ මාධ්‍ය පාසල්වල අඩුපාඩු හා වතු ජනාවාසවල මිනිසුන්ගේ ගැටලු පිළිබඳව පත්තරවල ලිපි පළ කරමින් විශාල සේවයක් කරන ලද බව ද පවසන ලදී.

මේ වන විට කොරෝනා වසංගතය අඩු වී රට හොඳ තත්ත්වයක පැවතිය ද ඉදිරියට විශාල අවදානමක් ඇති විය හැකි බව ද ජනතාව මෙම අවදානම අමතක කර වැඩ කටයුතු සිදු කරන බැවින් බළන්ගොඩ නගරය කොරෝනා රෝගයෙන් ආරක්ෂා කර ගැනීම සඳහා තවදුරටත් උනන්දු වී වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ද ඩෙංගු අවදානම වැඩි වෙමින් පවතින බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ද වර්ෂාව හේතුවෙන් මාර්ගයන් සියල්ලෙහිම තණකොළ වැවී ඇති අතර, සුද්ධ කිරීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් පැවසීය.

**ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා**

ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් දීර්ඝකාලයක සිට සහෝදරයෙක් සේ ළඟින් සිටි එස්. රාමාර් මහතාගේ අභාවය සම්බන්ධව එම මහතාගේ පවුලේ සියලු දෙනාට ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ හා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ ශෝකය ප්‍රකාශ කරන බව ද එතුමාගේ අභාවය නිසා ද්‍රවිඩ ජනතාවට විශාල පාඩුවක් සිදු වන බව ද ඔවුන් වෙනුවෙන් හඬක් නැඟීමට මාධ්‍යවේදීන් වශයෙන් එතුමා සහ සලාම් මහතා පමණක් සිටි බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් සිමෙන්ති නොමැති නිසා ඉතිරිව පවතින උඩකන්ද පාරේ වැඩ කටයුතු සිමෙන්ති පවතින්නේ නම් ඉටු කර දෙන ලෙස ද කරව්කැටිය, ගල්වල පාරේ අලුතින් විදුලි කණු යොදා ඇති අතර, පරණ විදුලි කණු ඉවත් නොකිරීම නිසා වාහන ගමනාගමනයට බාධා ඇති වී ඇති බැවින් එය ඉවත් කිරීමට කටයුතු කරන ලෙස ද පසුගිය දිනක සේනක ගුරුසිංහ මහතා විසින් කොඩි කණු 50 ක් සභාවෙන් ලබා දෙන ලෙස ඉල්ලා සිටිය නමුත් බළන්ගොඩ නගර සභාවේ කොඩි කණු 50 ක් නොමැති නිසා ලබා දීමට නොහැකි වූ බව ද ඒ සම්බන්ධව ලැජ්ජා වන බව ද මෙම තත්ත්වය තුළ සේනක ගුරුසිංහ මහතා කොඩි කණු 50 ක් ලබා දීමට සූදානම් බව තමන් හට පැවසුව බව ද අවුරුදු 02 ක හා 03 ක කාලයක් තිස්සේ සෑම අවස්ථාවක දීම කොඩි කණු සම්බන්ධව යෝජනා ගෙනා නමුත් ප්‍රාග්ධන වියදම් කිරීමට නොහැකි වීම මත කොඩි කණු, හට් සහ පුටු ගැනීමට නොහැකි වූ බව ද සභාව අක්‍රිය වී ඇති අතර, මේ නිසා ජනතාව අපහසුතාවයට පත්වන බව ද පවසන ලදී.

එමෙන්ම උඩකන්ද පාරේ වතුර පාර හරහා ගමන් කිරීම සම්බන්ධ ප්‍රශ්නයක දී එම ගමේ එක්තරා පුද්ගලයෙක් නිවාස 05 ක 06 ක මිනිසුන්ට කරදර කරන බව ද ඒ සඳහා නිළධාරීන් කිහිප වතාවක් ගියද

එය නොවිසිඳුණු බැවින් තමන් ලේකම්තුමියව දැනුවත් කළ බව ද එම අවස්ථාවේ දී ලේකම්තුමිය විසින් අවශ්‍ය පියවර ගත් බවද එම මිනිසුන් හට ක්ෂණිකව පැමිණෙන ලෙස කැඳවීමක් කර තිබූ බැවින් එසේ පැමිණීමට නොහැකි බව ද මේ සම්බන්ධව ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මාධ්‍යවේදී එස්.රාමාර් මහතාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය පළ කළ අතර, පුස්තකාල උපදේශන කමිටු රැස්වීම 2021-11-10 වන දින පැවැත්වෙන බවට ලිපිය අද දින ලැබුණු බව ද පවතින වැඩ කටයුතු සමඟ දිනය වෙන් කර ගැනීම අවශ්‍ය බැවින් දින කිහිපයකට පෙර එම දැනුම් දීම් සිදු කරන ලෙස ද කියවීම් ශාලාව අලුත්වැඩියා කිරීම, කියවීම් ලැල්ල දිරාපත් වී තිබීම නිසා එයට පිළියම් යෙදීම මෙන්ම පුස්තකාල නාම පුවරුව සකස් කිරීම ආදිය තවමත් ඉටු වී නොමැති බව ද උපදේශන කමිටුවේ දී මේ සම්බන්ධව විමසන බව ද තමන්ට අදාල ලිපි ශීර්ෂ තවම නොලැබී ඇති බව ද පවසන ලදී.

එමෙන්ම පොදු වැසිකිළිය සුදුසු තත්ත්වයකට ගැනීම සඳහා උදව් කිරීම සම්බන්ධව ස්තුතිය පළ කරන බව ද එම ස්ථානයේ මාලු ලොරි නවත්වා තැබීම හේතුවෙන් වැසිකිළියට ඇතුල්වීම අවහිර වී ඇති බව ද වාහන නවතා මාර්ගය අවහිර නොකරන ලෙස සඳහන් කර පුවරුවක් මෙන්ම සිංහල හා දෙමළ භාෂාවෙන් වැසිකිළිය ලෙස නම් කර අඩි 06 ක පමණ නාම පුවරුවක් සකස් කර දෙන ලෙස ද එය කොමර්ෂල් බැංකු හන්දියට දිස් විය යුතු බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, බස් නවතා තැබීම නිසා ඇවිදින මංතීරුවේ රෝපණය කිරීමට ගෙන ආ ගස් ගොඩ බෑමට නොහැකි වූ අවස්ථාවේ දී තමාගේ වාහනය නවත්වා බස් රථ අවහිර කළ බව ද ඉන්පසුව බස් රථ හිමිකරුවන් තමන් සමඟ සාකච්ඡා කළ අතර, බස් රථ නැවතීමට ඉඩමක් පවතින බව පැවසූ නමුත් එම ඉඩමට ප්‍රවේශ වීම සඳහා බෝක්කුවක් පවතින බව ද දිගින් වැඩි බස් රථ ඇතුල් කිරීමේ දී තවත් අඩි 06 ක්වත් තිබිය යුතු බව ද සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය ඉදිරිපිට වාහන නවත්වන බැවින් පුවරුවක් යොදන ලෙස ද තමන් කර්මාන්ත කමිටුවට යෝජනා කර සම්මත වූ වැඩ කටයුතු ඉටු කර ගැනීමට උදව් කරන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් එස්. රාමාර් මහතාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය පළ කරන අතර, එතුමා අවුරුදු ගණනාවක සිට විශාල සේවයක් කළ අයෙකු බව ද හුණුකුඹුර මාර්ගය කාපට් කර ඇති නමුත් පාරේ ආරම්භක ස්ථානයේ පෙට්ටි සාප්පුව ඉදිරියට වන්නට කාණුවක් පවතින අතර, එම මාර්ගයේ ගමන් කරන ඇතැම් වාහනවල යට වදින බැවින් එම ස්ථානය උස් කර සකස් කරන ලෙස ද පරගහකුඹුර මාර්ගයේ 80%ක් පමණ වැඩ කටයුතු අවසන්ව ඇති අතර, ඒ සම්බන්ධව ස්තුතිවන්ත වන බව ද ඉතිරි 20% ක ප්‍රමාණය අවසන් කර ගැනීමට සහයෝගය ලබා දෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම අද වන විට පොහොර, සීනි හා ගෑස් ආදී ගැටලු රැසකට ජනතාව මුහුණ දී ඇති බව ද එදා සහ අද වියදම ගත් විට දරා ගැනීමට නොහැකි වී තත්ත්වයකට පත්වී ඇති අතර, සභාවක් වශයෙන් ජනතාව මෙම දුකින් මුදවාලීමට ක්‍රමයක් පවතී නම් එය හඳුන්වා දිය යුතු බව ද රසායනික පොහොර නැවැත්වීම තුළ තේ කර්මාන්තය හා වී ගොවිතැන ඇතුළු වගාවන් අඩාල වී ඇති බව ද උද්ඝෝෂණ වැඩි වී ඇති අතර, බඩු මිළ ඉහළ යාම හෙළා දකින බව ද ජනතාව දුකින් මුදවා ගැනීමට හේතු වාසනාව ලැබේවා යි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් රටේ ප්‍රශ්න සම්බන්ධයෙන් විශාල කතිකාවතක් ඇති වී ඇති අතර, පොහොර ගැටලුව මුල් කරගෙන ගොවීන් ආවේගශීලීව හැසිරෙමින් උද්ඝෝෂණ පවත්වන බව ද ලෝකයේ පවතින වගා බිම්වලින් 1.5% ක් වූ කුඩා බිම් ප්‍රමාණයක පමණක් කාබනික පොහොරවලින් වගා කටයුතු කරන බව ද ඊට හේතුව වී ඇත්තේ පිරිවැය වැඩි වීම බව ද ගරු ජනාධිපතිතුමා වී කිලෝ එකක් රුපියල් 150.00 කට මිල දී ගන්නා බව පවසන නමුත් එසේ මිල දී ගතහොත් පාරිභෝගිකයා සහල් කිලෝ එකක් මිල දී ගැනීමට සිදු වන්නේ කීයකටදැයි ප්‍රශ්නයක් ඇතිවන බව ද අවුරුදු තුනක් සහ අටක් ඇතුලත රසායනික පොහොර භාවිතා නොකළ බවට සහතිකයක් අවශ්‍ය වන නමුත් ඒ සඳහා ලංකාවේ ආයතනයක් නොමැති අතර, විදේශ රටකින් ලබා ගැනීමට සිදු වන බව ද පවසන ලදී.

එමෙන්ම අවුරුදු 10ක් ඇතුලත කාබනික වගාවට යොමුවන බව සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ පැහැදිලිව සඳහන්ව ඇති නමුත් මෙය ආරම්භ කළේ එක් කන්නයක් අවසන් වී අනෙක් කන්නය ආරම්භ වීමට ප්‍රථම බව ද ආණ්ඩුව පොහොර ගෙන්වීමට මුදල් නොමැති නිසා මෙම තීරණය ගෙන ඇති බව ද මේ වන විට විදේශ සංචිත ඩොලර් බිලියන 2.5 ක් පමණක් පවතින අතර, ජනවාරි මාසයේ දී ඩොලර් මිලියන 500 ක් හා ජූනි මාසයේ දී බිලියනයක් ගෙවීමට ඇති බව ද ඒ අනුව ඉතිරි වන්නේ ඩොලර් බිලියන 01 ක් බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා, වකුගඩු රෝගය පැතිරීමට හේතුව රසායනික පොහොර වන බව ආණ්ඩුව විසින් පවසන නමුත් රසායනික පොහොර භාවිත කරන නුවරඑළිය, කල්පිටිය හා යාපනය ආදී ප්‍රදේශවල වකුගඩු රෝගය ව්‍යාප්ත වී නොමැති බව ද වකුගඩු රෝගය වැළඳුණු 59% ක් දියවැඩියා රෝගීන් බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් ලංකාවට ගෙන්වන පොහොර ඉතාම බාල තත්ත්වයේ පවතින අතර, යූරියා හැර අනෙකුත් පොහොර වර්ග ලංකාවේ තිබෙන බව ද යූරියා සඳහා නයිට්‍රජන් 46% ක් අන්තර්ගතව ඇති අතර, කාබනික පොහොරවල නයිට්‍රජන් පවතින්නේ 3%-4% ක් පමණක් වීම නිසා එක් පැලයකට විශාල ප්‍රමාණයක් කාබනික පෙහොර යෙදීමට සිදු වන බව ද පැවසීය. එමෙන්ම කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඇතැම් අමුද්‍රව්‍ය ශ්‍රී ලංකාවේ නොමැති නිසා කාබනික පොහොර විදේශ රටවලින් ගෙන්වන අතර, එම පොහොරවල අහිතකර ක්ෂුද්‍ර ජීවීන් සිටින බව ලංකාවේ පරීක්ෂණාගාර වාර්තාවලින් තහවුරු වන බව ද මෙම පොහොර භූමියට යෙදීම මගින් භූමියේ විවිධ විපර්යාසයන් ඇති වී වගා කිරීමට නොහැකි තත්ත්වයකට පත්විය හැකි බව ද මෙවැනි තීරණ ගනු ලබන්නේ කුමන බලාපොරොත්තුවකින්දැයි විශාල සැකයක් ඇති වන බව ද විශේෂයෙන් ශ්‍රී ලංකාවේ මේ සම්බන්ධ විශේෂඥයන් සිටින නමුත් ඔවුන්ගේ උපදෙස් ලබා නොගෙන

හිතුවක්කාර තීරණ ගැනීම තුළින් මෙවැනි ගැටලුකාරී තත්ත්වයක් ඇති වී ඇති බව ද කොම්පෝස්ට් සම්බන්ධව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධියක් හිමි හේමකුමාර නානායක්කාර මහතා පසුගිය දිනක "මේක ගත්ත තකතීරු තීන්දුවක්" වශයෙන් ප්‍රකාශ කරමින් දැඩි ලෙස විවේචනය කළ බව ද වතු හිමිකරුවන් පමණක් නොව කම්කරු ප්‍රජාව ඇතුළු සියලුම දෙනාට මෙම තත්ත්වය බලපාන බැවින් ඉදිරියේ දී හොරු මංකොල්ලකාරයන් පවා බිහි විය හැකි බව ද පවසන ලදී.

එමෙන්ම පසුගිය කාලයේ අධිකරණයට අපහාස කිරීම නිසා අවුරුදු 06ක සිර දඬුවමක් පවා ලැබූ ඥානසාර හිමියන් කාර්යසාධන බලකායේ සභාපති වශයෙන් පත් කිරීම හා මෑතකදී විශ්ව විද්‍යාලයන්හි උප කුලපති තනතුරු සඳහා කරනු ලැබූ පත්කිරීම් ආදිය ද ඇතුළුව සිදුවන්නා වූ ක්‍රියාකාරකම් හේතුවෙන් සියලුම දෙනා නොසතුටින් සිටින අතර, පසුගිය මැතිවරණයේ දී ආණ්ඩුව බලයට ගෙන ඒමට කැප වුණු බොහෝ පිරිසක් ජනතා විමුක්ති පෙරමුණ සමඟ සාකච්ඡා කරමින් සිටින බව ද වැරදි ආර්ථික ක්‍රමය නිවැරදි කරන තුරු මෙම අර්බුදවලින් ගැලවීමක් නොමැති බව ද අර්බුද වැඩි වීමත් සමඟ හොරු මංකොල්ලකාරයන්, ආවේගශීලීව හැසිරෙන්නන් හා උන්මත්තකයන් බිහි විය හැකි අතර, ආහාර අහේනියක් අනිවාර්යෙන් ඇති වන බව ද අවසානයක් නැති විකිණීම් හේතුවෙන් ගැටලු රාශියක් ඇති වන බව ද විශේෂයෙන් කොළඹ පෝට් සිටි ආශ්‍රිතව පවතින ප්‍රධාන ගොඩනැගිලි ඇතුළු විශාල භූමි ප්‍රමාණයක් විදේශයන්ට විකිණීමට සැලසුම් සකස් කර ඇති බව ද උතුරු මැද පළාතේ අක්කර එක් ලක්ෂ හාර දහසක් කෝමාරිකා වගාව සඳහා විදේශීය සමාගමකට වෙන් කර දී ඇති බව ද එම අක්කර එක්ලක්ෂ හාර දහස ඇතුලත හේන් ගොවිතැන, සත්ව පාලනය ආදී ක්ෂේත්‍රයන්හි නියැලෙන්නන් සිටින අතර, ඉදිරියේ දී මෙම ජනතාව භූමියෙන් ඉවත් කර වන අලින්ගෙන් ආරක්ෂා කර ගැනීමට යැයි පවසා විදුලි වැටවල් ඉදිකළ හැකි බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා, මෙය සමාජ ගැටලුවක් බවට පත් වී අවසානයේ දී චීනය, ඉන්දියාව හෝ ඇමරිකාවේ කෙළි මඬලක් හෝ ප්‍රාන්තයක් බවට මෙම රට පත් විය හැකි බව ද එවිට තමන් කුමන පක්ෂයේ ද යන්න නොව පොදුවේ සියලුම දෙනාට ම ප්‍රශ්නයන් සඳහා මුහුණ දීමට සිදුවන අතර, එය වළක්වා ගත නොහැකි බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් එස්. රාමාර් මහතාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය පළ කරන අතර, එතුමා අවුරුදු ගණනාවක සිට විශාල සේවයක් කළ අයෙකු බව ද දීර්ඝ කාලයක් සේවය කර මිය ගිය මාධ්‍යවේදී ගාමිණී වික්‍රමසිංහ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමට ද අද දින තමන් අවස්ථාවක් කර ගන්නා බව ද පවසන ලදී.

එමෙන්ම තමන් සභාවට පැමිණ අවුරුදු 25 කට ආසන්න කාලයක් වූ අතර, මාළු කඩය සම්බන්ධ ගැටලුව අවුරුදු 22 ක් තිස්සේ සාකච්ඡා කරන නමුත් විසඳුමක් ලැබී නොමැති බව ද නගර සභාවට 100% ක් අයිති දේපලක පොඩි නඩුවක් අවුරුදු 20 ක් පවත්වාගෙන යාමට නඩු ගාස්තු වශයෙන් මහජනතාවට සේවය කිරීමට පවතින බදු මුදලින් ලක්ෂ ගණනක් ගෙවා ඇති බව ද මෙම නඩුව විසඳා ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් කණගාටු වන බව ද සභාවේ යෝජනාවක් සභා සම්මත කර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කළ විට එතුමා නැවත ලිපියක් එවා ඇති අතර එහි දී එතුමාට විරුද්ධව තීරණයන් ගැනීමට සිදු වූ බව ද එය හොඳ තත්ත්වයක් නොවන බැවින් ඉක්මනින් මෙම ගැටලුව විසඳා සියලු දෙනාට

සාධාරණය, යුක්තිය ඉෂ්ට කළ යුතු බව තමන්ගේ විශ්වාසය බව ද මාළු කඩයේ හිමිකාරිත්වය දරණ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරයෙක් සිටි නමුත් එතුමාට ද මෙය විසඳා ගැනීමට නොහැකි වූ බව ද තමන් සභාපතිවරුන්ට චෝදනා නොකරන නමුත් උනන්දුව මදි වීම නිසා සාමදානයෙන් හෝ නඩුවකින් විසඳා ගැනීමට තිබුණු ප්‍රශ්නයක් අනවශ්‍ය කාලයක් දුර දිග ගිය බව තමන්ගේ විශ්වාසය බව ද ඉදිරියේ දී මෙය ඉක්මනින් නිරාකරණය කර ගැනීමට සියලු දෙනාටම ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා සභාපතිවරයා ඉවත් කර වැඩ කරන ලෙස අප කණ්ඩායමට පවසන නමුත් මෙය ප්‍රජාතන්ත්‍රවාදී රටක් නිසා මෙන්ම ගැටලුවක දී නීතිමය තීන්දු සමඟ සිටින බැවින් එසේ නොකරන බව ද විවිධ අදහස් හා මති මතාන්දර පවතින නමුත් යම් යම් යෝජනාවන් සඳහා අනුමැතිය ලබා දෙන බව ද එසේ කරනු ලබන්නේ ගරු සභාපතිවරයාට ඇති බියකට හෝ හිතවත්කමකට හෝ නොවන බව ද සභාවේ බහුතර බලයක් නොමැතිව අවශ්‍ය අනුමැතියන් ලබා දෙනු ලබන්නේ මහජනතාව පීඩාවට පත් නොකිරීම සඳහා බව ද වැඩ කටයුතු රැසක් අතපසු වී ඇති අතර, සභාව අකාර්යක්ෂම වී ඇති බව ද සභාවේ ඇතැම් නිළධාරීන් වැඩ කරන නමුත් ඇතැමුන්ගෙන් අවශ්‍ය සේවාව නොලැබෙන බව ද හිටපු සභාපතිවරයාගේ පාලන කාලයේ දී යම් යම් අඩුපාඩු පැවතියත් නිළධාරීන්ගෙන් කාර්යක්ෂම සේවයක් ලබා ගත් බව ද එතුමාගේ අඩුපාඩු සම්බන්ධව තමන් එවක විවේචනයන් කළ බව ද පවසන ලදී.

එමෙන්ම අද වන විට කොරෝනා වසංගතය හේතුවෙන් ලෝකයේ සියලු රටවල් අපහසුතාවයට පත්ව ඇති මොහොතක වත්මන් රජය සියලුම සේවකයන් හට වැටුප් ලබා දුන් බව ද උද්ඝෝෂණවල දී ප්‍රහාර එල්ල නොකළ බව ද අතිගරු ජනාධිපතිතුමාගේ මූලික පරමාර්ථය වූයේ ජීවිත ආරක්ෂා කර ගැනීම බව ද දියුණු රටවල පවතින සෞඛ්‍ය අංශයන් අභිබවා යමින් ශ්‍රී ලංකාවේ පූර්ණ එන්නත්කරණය සිදු කර ජීවිත ආරක්ෂා කර ගත් බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා කාබනික පොහොර සම්බන්ධව කරුණු දැක්වීමේ දී සම්පූර්ණයෙන්ම කාබනික පොහොරවලින් වගා කිරීමට ලෝකයේ රටවල්වලට නොහැකි වී ඇති බව පැවසීම සත්‍යයක් වන නමුත් ලෝකයේ කිසිදු රටක් තම රට තුළ පවතින ත්‍රස්තවාදී යුද්ධයක් නිමා කර ගෙන නොමැති වුව ද ශ්‍රී ලංකාවේ එය අවසන් කළ බව ද පොහොර ප්‍රශ්නය ලෝකයේ කිසිඳු රටක් ජය නොගත් එවැනිම වූ අභියෝගයක් බව ද පසුගිය දිනක පාඨලී චම්පික රණවක මැතිතුමා නැනෝ යූරියා පොහොර සඳහා ශ්‍රී ලංකාව කරනු ලබන වියදම සම්බන්ධ වීඩියෝවක් නිකුත් කර තිබුණ නමුත් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන්නේ නැනෝ යූරියා නොව නැනෝ නයිට්‍රජන් බව ද පැවසීය.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමාගේ මුලින් පැවති දේශපාලන න්‍යාය පත්‍රය සම සමාජ පක්ෂය වූ අතර, ඒ කාලයේ ජනතා විමුක්ති පෙරමුණෙහි ක්‍රියාකාරකම් සම්බන්ධව එතුමා කැමැත්තක් නොදැක් වූ නමුත් මේ වන විට ජනතා විමුක්ති පෙරමුණ සමඟ එකතු වී කටයුතු කරන බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා, අවශ්‍ය කරන ආහාර ද්‍රව්‍ය ඇතුළු නිෂ්පාදනවලින් 70% ක් පමණ ආනයනය කරන බව ද එම ආනයනයන් නවතා රට තුළ එම නිෂ්පාදනයන්

සිදු කිරීමට දරන උත්සාහය වැරැද්ද යන්නත් කුමන හෝ හේතුවක් මත පොහොර, බෙහෙත් හා ආහාර ද්‍රව්‍ය ගෙන්වීමට නොහැකි වුවහොත් කුමක් කරන්නේ දැයි විමසන ලදී. රට තුළ මෙම නිෂ්පාදනයන් සිදු කිරීම සඳහා යොමු වීම අමාරු කාර්යයක් වන අතර, ඇතැම් විට ඡන්දයෙන් පරාද වීමට එය හේතුවක් විය හැකි බව ද ඡන්දයෙන් පරාද වුවත් මෙම රටට හොඳ දෙයක් කිරීමට දායක වූ බව හෘද සාක්ෂිය දන්නා බැවින් එහි ගැටලුවක් නොමැති බව ද පවසන ලදී.

තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා ඉදිරි කාලයේ දී මේ රටේ සාගතයක් ඇති විය හැකි බවට තමන්ගේ ද විශ්වාසයක් පවතින බව ද එසේ වුවහොත් අනාගතයේ දී සාම සාධක බලකායක් පැමිණීමට ඉඩ ඇති බව ද එසේ නොවේවායි ප්‍රාර්ථනා කරන බව ද පැවසීය. විශේෂයෙන් පොහොර අර්බුදය සැලකීමේ දී එය බිලියන 100 ක කාර්යයක් බව ද එම බිලියන 100න් එක් බිලියනයක් මේ රටේ NGO වලට ගැති අයට වියදම් කළහොත් මෙය අනික් පැත්ත පෙරළිය හැකි බව ද ගරු ජනාධිපතිතුමා හා ගරු අගමැතිතුමා යම්කිසි පිරිසක් විසින් නොමඟ යවා ඇති බව ද තාප්පවල චිත්‍ර ඇඳපු තරුණ පිරිස් පාස්පෝට් පෝලිම්වල සිටීම සම්බන්ධව ගරු අග්‍රාමාත්‍යවරයා කණගාටුවෙන් කතා කළ බව ද සත්‍ය කෙදිනක හෝ තේරුම් ගෙන මෙම රට වැටී ඇති අගාධයෙන් ගොඩ ගැනීමට සියලුම දෙනාටම ශක්තිය ලැබේවා යි පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**13. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කාබනික පොහොර සංකල්පයෙහි තිබෙන එකම ගැටලුව වන්නේ එය අප රටට පූර්ව දැනුම් දීමකින් තොරව ක්‍රියාත්මක කිරීම බවද ඉදිරියේ දී එළවළු මිල සීඝ්‍ර ලෙස ඉහළ යන බවත්, පොහොර නොමැති නිසා වගා කටයුතු සිදු නොවන බැවින් මෙම කාලසීමාව අවසන් කාලය බවත්, ජීවත්වීමට ක්‍රමයක් නැති වන බවත් බණ්ඩාරවෙල එළවළු තොග වෙළඳපොළෙහි කිහිප දෙනෙක් තමන්ට පැවසූ බව ද නිරෝධායන ඇඳිරිනීතිය පැන වූ කාල සීමාවේ කොරෝනා වෛරස ව්‍යාප්තිය අඩු වූ නමුත් රට විවෘත වීමත් සමඟ නැවත හිස ඔසවා ඇති බව ද නිසි විද්‍යාත්මක ක්‍රමවේදයකින් තොරව පාසල් විවෘත කිරීම නිසා කුඩා දරුවන් මෙම වෛරසයට ගොදුරු වෙමින් සිටින බව ද මෙහි සීඝ්‍ර වර්ධනයත් සමඟ ඉදිරියේ දී නැවතත් රට වසා දැමීමට සිදුවන බව රජය පවසන අතර, පසුගිය දිනක චන්න ජයසුමන අමාත්‍යවරයා රජය විසින් කරන ලද එන්නත්කරණ වැඩසටහන පිළිබඳ ජනතාවගෙන් සමාව ඉල්ලූ බව ද ලෝකයේ වේගවත්ම එන්නත්කරණය ශ්‍රී ලංකාවේ සිදු වන බවට විශාල ආඩම්බරයකින් පැවසුව ද පරීක්ෂණාගාර සත්ත්වයන් වශයෙන් අපව භාවිත කර ඇති බව ද ගරු ජනාධිපති, අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය හා ඔවුන්ගේ ඥාතීන් සියලුම දෙනාට ලෝකයේ හොඳම එන්නත් ලබා දී ඇති බව ද රටේ අනෙකුත් සියලු දෙනාට ලබා දී ඇත්තේ වසංගතය සඳහා 100%ක් නිර්මාණය කළ එන්නතක් නොවන බව ද පවසන ලදී.

එමෙන්ම රටේ අනාගතය බාර ගැනීමට සිටින දරුවන් සම්බන්ධයෙන් ලොකු අවදානම් තත්ත්වයක් ඇති වී ඇති අතර, රටේ විශාල සංවර්ධනයක් සිදු වන බවට මවා පෑමක් සිදු වන බවද ඒ සඳහා කෝටි ප්‍රකෝටි ගණන් වියදම් කරන අතර මුදල් මුද්‍රණය කරන බව ද සිම්බාබ්වේ රටෙහි ඩොලර් 01ක් ඇමරිකානු ඩොලර් 01කට සමාන කර තිබුණු කාලයක් පැවති නමුත් මේ වන විට පාන් ගෙඩියක් ගැනීමට සිම්බාබ්වේ ඩොලර් ට්‍රිලියනයක් අවශ්‍ය වන බව ද බොරුව, වංචාව, දූෂණය, නොහැකියාව හා අකාර්යක්ෂමතාව අද රටේ පැතිරී ඇති බව ද පැවසීය.

තවදුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, මීට පෙර අපගේ පසෙහි සිටිය නැති ක්ෂුද්‍ර ජීවීන්, බැක්ටීරියා එකතු වී පස විනාශ වෙමින් පවතින බව ද දේශීය බෝග වර්ග අහිමි වී ඇති අතර, ආහාර නිෂ්පාදනය නැති වී සාගතයක් ඇති විය හැකි බව ද ඉදිරියේ දී යටත් විජිතයක් බවට අප රට පත්විය හැකි බව ද පැවසූ ගරු සභාපතිතුමා, පක්ෂ භේදයකින් තොරව හරි දේ හරි විදියටත් වැරදි දේ වැරදි විදියටත් දැකිය යුතු බව ද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමාගේ එම ගුණාංගය අගය කරන බව ද පවසන ලදී.

අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු උප සභාපතිතුමා මන්ත්‍රී මණ්ඩලය ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.2.05 ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.